ආඛ්‍යාන Narrations
Volume 03 | Issue 01&02 | 2018 | Article 01
ISBN 2478-0642

On-line Refereed Journal of the Center for Indigenous Knowledge and Community Studies
Sabaragamuwa University of Sri Lanka

Follow this and additional works at: www.sab.ac.lk
e-mail: akyanaeditor@ssl.sab.ac.lk



# සම්ප්‍රදායෙන් විද්‍යාත්මක ප්‍රවේශයට: යටත් විජිත හා පශ්චාත් යටත් විජිත අවධි තුළ අර්බුදයට ලක්වන උරුම සංරක්ෂණයේ තිරසාරභාවය

අරුණ රාජපක්ෂ[1]
tsaru2003@yahoo.com
BA(sp),PG Dip.MA.PhD

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ උරුම සංරක්ෂණය සම්බන්ධයෙන් සිදු වන හඳුන්වාදීම් ඔස්සේ සිදු වන පරිවර්තනයක් අප විසින් තේරුම් ගත යුත්තේ ඊට පූර්ව අවධිවලට සාපේක්ෂවය. එහිදී පූර්ව යටත් විජිත අවධිය තුළ දේශීය අනන්‍යතා මත පදනම් වූ සාම්ප්‍රදායික සංරක්ෂණ ප්‍රවේශයක් තුළ දේශීය උරුම ස්ථානවල තිරසාරභාවය තහවුරු වූ අතර යටත් විජිත අවධිය තුළ සාම්ප්‍රදායික ප්‍රවේශයෙන් විද්‍යාත්මක අවශ්‍යතාවයන් අරමුණු කර ගත් වෘත්තීමය ආයතනමය ප්‍රවේශයක් වෙත ගමන් කිරීම හඳුනා ගත හැකි අතර එය දේශීය ප්‍රජා විරෝධතාවලට ද හේතු විය. පශ්චාත් යටත් විජිත අවධිය තුළ ජාත්‍යන්තර ප්‍රවේශයක් වෙත දෝලනය වීම තුළ දේශීය ආගමික ප්‍රජා අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගැනීමට අපොහොසත් වීම වර්තමානයේ උරුමය හා සම්බන්ධ අර්බුද රැසකට හේතු වී ඇත .

ප්‍රමුඛ පද: උරුම සංරක්ෂණය, දේශීය අනන්‍යතා, යටත් විජිත අවධිය, පශ්චාත් යටත් විජිත අවධිය

[1]Senior Lecturer, University of Peradeniya.

**ප්‍රවේශය**

උරුම සංරක්ෂණයේ ඓතිහාසික පරිණාමයෙහි හැරවුම් ලක්ෂයක් පදනම් කරගනිමින් අධ්‍යයනයේ තේමානුගතව අධ්‍යයනය පහසුව සඳහා එදා මෙදා තුර ශ්‍රී ලාංකේය උරුම සංරක්ෂණ ප්‍රවේශ පහත සඳහන් පරිදි බෙදා දැක්විය හැකි ය.

| | |
|---|---|
| 1. පූර්ව යටත් විජිත අවධිය<br>(Pre - Colonial Period) | දේශීය සාම්ප්‍රදායික සංරක්‍ෂණ ප්‍රවේශය |
| 2.ක්‍රි. ව. 1505 යටත් විජිත අවධිය<br>(Colonial Period) | ▪ යටත් විජිත රාජ්‍ය හා ආයතනමය ප්‍රවේශය<br>▪ යටත් විජිත විරෝධී ප්‍රජා ප්‍රවේශය |
| 3. පශ්චාද් යටත් විජිත අවධිය<br>(Post Colonial ) | දේශීය හා ජාත්‍යන්තර සම්මිශ්‍ර ප්‍රවේශය<br>▪ 1948 වර්ෂයේ සිට 60 වර්ෂය දක්වා<br>▪ 1960වර්ෂයේ සිට 80 වර්ෂය දක්වා<br>▪ 1980 සිට වර්තමානය දක්වා |

විජේසූරිය (1993) විසින් ශ්‍රී ලංකාවේ උරුම සංරක්ෂණයේ කාල අවකාශ හා මැදිහත්වීම් සන්දර්භය පදනම් කර ඓතිහාසික හා ආයතනමය දෘෂ්ටිකෝණයක් තුළ සිදු වූ පරිණාමීයත්ත්වය විග්‍රහ කර ඇත. ඒ අනුව පරිණාමීය දෘෂ්ටිකෝණයෙන් ක්‍රි. ව. තුන්වන සියවසේ සිට යටත් විජිත අවධිය දක්වා බෞද්ධ සංකේත පදනමීය සංරක්ෂණ සම්ප්‍රදායක ගති ලක්ෂණ මූලාශ්‍රගත තොරතුරු ඇසුරින් මෙහිලා විග්‍රහ කරන අතර, ආයතනමය දෘෂ්ටිකෝණයෙන් යටත් විජිත පාලන සමය තුළ හා විශේෂයෙන් ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව 1890 ස්ථාපිත වීමට පෙර සහ පසු අවධිය තුළ පුරාවස්තු, ස්මාරක, ක්ෂේත්‍ර සම්බන්ධ පුරාවිද්‍යාත්මක මැදිහත්වීම් (Interventions) පදනම්ව පහත සඳහන් පරිදි වර්ගීකරණයකට ලක් කර, විග්‍රහයක යෙදෙයි.

1. ගවේෂණාත්මක අවධිය (Exploratory Period)-1910 පෙර
2. තහවුරු කිරීමේ අවධිය (Consolidatory Period) - 1910 - 1940
3. අර්ථකථනාත්මක අවධිය (Explanatory Period) - 1940 – 1960 | 1960 - 1990

පුරාවිද්‍යාත්මක සහ වාස්තුවිද්‍යාත්මක මැදිහත්වීම් පදනම් කරගෙන මෙසේ සිදු කළ වර්ගීකරණය තුළ පසුගිය දශක තුන තුළ උරුම සංරක්‍ෂණය සම්බන්ධයෙන් සිදු වූ පරිණාමීය තත්ත්ව ප්‍රමාණාත්මකව විග්‍රහ නොවීම තුළ සහ 1940 න් පසු කාල පරිච්ඡේදය හුදු අර්ථකථනාත්මක අවධියක් ලෙස පමණක් තේරුම් ගැනීම අපහසු ය. එසේ ම උක්ත කාල පරිච්ඡේද තුළ සිදු වූ මැදිහත්වීම්වල විවිධතාව විමසන විට එය හුදෙක් තත් මැදිහත්වීමට පමණක් සීමා කිරීම උරුම සංරක්‍ෂණය සමග බද්ධ වූ සමාජ, දේශපාලන යථාර්ථය අමතක කිරීමකි.

**සාකච්ඡාව**

**යටත් විජිත අවධිය**

විදේශීය ආක්‍රමණයන්ගෙන් සහ බලපෑම්වලින් කලින් කල අහිතකර ලෙස විනාශකාරී බලපෑම්වලට මුහුණ දෙමින්, එය ම ආශීර්වාදයක් කරගනිමින්, යාන්ත්‍රණය ශක්තිමත් කරගනිමින් හිස ඔසවා ජීවමානව පවත්වාගෙන ආ උරුම සංරක්ෂණ යාන්ත්‍රණයේ සාම්ප්‍රදායික ගමන් මග තීරණාත්මක ලෙස අභියෝගයට ලක්වන්නේ ලංකාව 1505 සිට 1948 දක්වා පෘතුගීසි, ලන්දේසි සහ ඉංග්‍රීසි යන බටහිර ජාතීන් තුනෙහි යටත් විජිතයක් බවට පත් වීමෙනි. මෙම කාල පරාසය දෘෂ්ටිකෝණ දෙකකින් පරීක්ෂා කළ යුතු වේ. එනම්,

යටත් විජිත පාලකයින් දේශීය සංස්කෘතික උරුම සංරක්ෂණය කෙරෙහි ක්‍රියාත්මක වූ ආකාරය දේශීය සංස්කෘතිය සහ උරුම පිළිබඳව යටත් විජිත පාලකයන්ගේ ආකල්ප සහ ප්‍රවේශ අතිශයින් සංකීර්ණ වේ. විටෙක එය හුදු විද්‍යාත්මක මුහුණුවරක් ද, විටෙක පැවති සම්ප්‍රදායන් දැඩි ලෙස අභියෝගයට ලක් කිරීමක් ලෙස ද, තවත් විටෙක සිතාමතා සැලසුම් සහගත ලෙස විනාශකාරී අයුරින් මැදිහත්වීම් ස්වරූපයක් ද උසුලයි. රාජධානිය කෝට්ටේ (ක්‍රි. ව. 1415 - 1597) ලෙස පවතින අවධියේ පළමු බටහිර විදේශීය ආක්‍රමණය 1505 දී පෘතුගීසීන්ගෙන් ද, අවසන් රාජධානිය මහනුවර ලෙස පවතින අවධියේ එනම්, 1656 දී දෙවන බටහිර විදේශීය ආක්‍රමණය ලන්දේසීන්ගෙන් ද, තෙවන බටහිර විදේශීය ආක්‍රමණය 1796 දී ඉංග්‍රීසි ජාතිකයන්ගෙන් ද එල්ල විය. ශ්‍රී ලංකාව පූර්ණ යටත් විජිතයක් බවට පත්වන්නේ 1815 දී ය. ඒ අනුව ක්‍රි. ව. 1505 සිට ක්‍රි. ව. 1815 දක්වා කාලය යටත් විජිත යුගය ලෙසට ගෙන අධ්‍යයනය කලත් තත්කාල පරාසය තුළ දේශීය පාලකයින් හා ප්‍රජාව විදේශීය පාලකයින්ගේ අභිමතයෙන් තොරව සිදු කළ උරුම සංරක්ෂණ කටයුතු ද දේශීය රාජ්‍ය පාලනය අවසන් වීම සහ විදේශීය පාලනයට නතු වීම අතරතුර සංක්‍රාන්ති සමයක් ලෙස ගෙන නිරීක්ෂණය කිරීම වැදගත් වේ. රටේ මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රිතව විදේශීය පරිපාලනයක් ක්‍රියාත්මක වෙමින් පවතින අතරතුර උරුමස්ථානවලට ඔවුනගෙන් එල්ල වන විනාශකාරී අභියෝග මේ කාල පරාසය තුළ අත්විඳීමට දේශීයයන්ට සිදු විය. මෙම අභියෝගය හමුවේ කන්ද උඩරට කේන්ද්‍ර කරගනිමින් තදාසන්න ප්‍රදේශයත්, සුළු වශයෙන් පර්යන්ත ප්‍රදේශත් පදනම් කරගත් යුගයට ම අනන්‍ය වූ සංස්කෘතික සම්ප්‍රදාය රැසක් බිහිවීමට පසුබිම සැකසිණ. චිත්‍ර, වාස්තු විද්‍යා, ජන කලා ආදී ක්ෂේත්‍ර ඔස්සේ ද උඩරට සම්ප්‍රදායක් බිහිවිය. විශේෂයෙන් වාස්තු විද්‍යාව සහ චිත්‍ර කලාව පදනම් කරගත් මහනුවර යුගයට ආවේණික වූ සංරක්ෂණ සම්ප්‍රදායක්ද ජනිත විය. මෙකී සම්ප්‍රදායන්ගේ පැවැත්ම වැඩවසම් රජු කේන්ද්‍ර කරගත් රාජකාරී ක්‍රමය කුල පදනමක් සහිත සමාජ සංවිධානයක් හරහා සැකසිණ (මල්සිරි 2011: 177). මෙම කටයුතු පසුපස එවකට රාජ්‍ය විචාළ පළමුවන විමලධර්මසූරිය ( ක්‍රි. ව. 1592 - 1604), දෙවන රාජසිංහ (ක්‍රි. ව. 1633 - 1687), කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රි. ව. 1747 - 1781) සහ ශ්‍රී වික්‍රම රාජසිංහ (ක්‍රි. ව. 1798 - 1815) ආදි රජවරු වැදගත් වෙයි. දේශීය රජ පරපුරේ ම රජ පුරුකක් බවට අනුගත වූ විදේශීය සම්භවයක් සහිත නායක්කර් වංශික ශ්‍රී වික්‍රම රාජසිංහගේ ක්‍රියාකාරකම් පවා දේශීය සංස්කෘතික සම්ප්‍රදායේ ප්‍රගමනයට දැක්වූ සහයෝගය දේශපාලනික ලෙස තත්කාලීනව එල්ල වී තිබූ බාහිර විදේශීය පාලකයින්ගේ සහ දේශීය රදලවරුන්ගේ අභියෝගය හමුවේ දේශීයත්වයට අනුගත වෙමින් සිය ප්‍රතිරූපය ජනප්‍රිය කරවීමේ දේශපාලනික උපායමාර්ගයක් ලෙස සමහරුන් අර්ථකථනය කළ ද (දේවරාජා 1997: 226) මෙය

ආගමික උරුමස්ථානයන්ගේ අභිවෘද්ධිය සඳහා හේතු විය. එම කටයුතු විදේශීය අභියෝගය හමුවේ රටේ බොහෝ ප්‍රදේශවල උරුමස්ථාන විනාශ වෙමින් පැවති විට සිය බල ප්‍රදේශය තුළ ආගමික ස්ථාන තුළ පුනරුදයක් උදා කරවීමට සමත් විය. මොහු විසින් විහාර ප්‍රතිසංස්කරණය සහ නඩත්තුව සිදුකළ ඉඩකඩම් ප්‍රදාන සහ නෛතික ප්‍රතිපාදන සම්බන්ධ තොරතුරු රැසක් තත්කාලීන සන්නස් සහ තුඩපත් වැනි අභිලේඛන පරීක්ෂාවෙන් පැහැදිලි වෙයි (ධම්මානන්ද 1969; කුමාර 1992: 43; වනරතන 2008: 3).

බටහිර විදේශීය ආක්‍රමණත් සමග ඒ දක්වා ශ්‍රී ලාංකේය උරුම සංරක්ෂණයේ ජීවමාන සක්‍රීය නියෝජනයක් වූ භික්ෂු පරපුරේ පරිහානියක් පිළිබඳව රක්ඛංග සන්දේශය, පුණ්‍ය ක්‍රියා සන්දේශය මූලාශ්‍රයවල විස්තර කෙරෙයි (ධම්මානන්ද 1969: 224). මේ සඳහා සෘජුව හේතු වූයේ සමකාලීන පාලකයින් වූ සීතාවක රාජසිංහ වැනි පාලකයින්ගේ අදූරදර්ශී ක්‍රියාකලාප යි. මේ සමග ශ්‍රී ලාංකේය තිරසාර උරුම සංරක්ෂණ යාන්ත්‍රණයේ ප්‍රබලම ගාමක බලවේගය වූ භික්ෂුවගේ භූමිකාව යම් ප්‍රමාණයකට අක්‍රීය වීම හරහා යාන්ත්‍රණයේ පැවැත්ම අසමතුලිත වීම තුළ රික්තකයක් නිර්මාණය විය. මෙම රික්තකය කිසිදු ආදේශකයකින් සම්පූර්ණ කළ නොහැක්කක් විය. රික්තකයේ ප්‍රබලත්වය අප අවබෝධ කරගත යුත්තේ එතෙක් කවර දුෂ්කර පසුබිමක වුව ද උපදේශකයෙකු, අධීක්ෂකයෙකු, කළමනාකරුවෙකු, සැලසුම්කරුවෙකු, ආරක්ෂකයෙකු මෙන්ම ස්ථිර භාරකරුවෙකු ලෙස විවිධ භූමිකා නිරූපණය වූ භික්ෂුව කේන්ද්‍ර කරගනිමිනි (මල්සිරි 2011: 184). මේ හිදැස තදනන්තරව බෞද්ධාගමික ස්ථාන භාරකාරත්වයට පැමිණෙන ගණින්නාන්සේලාගෙන් සම්පූර්ණ වූවා යැ යි කීමට අපහසු ය. එතෙක් පුද්ගලයන් ලෙස ඔවුනගේ මැදිහත්වීම සාපේක්ෂව සාධාරණ ඇගයීමකට ලක්විය යුතු ය. ඤාණවිමල හිමියන් (2001)පවසන පරිදි,

> "මොවුන් සසුන කෙරෙහි ඇල්මක් ඇතිව සිටි කොටසක් වීම නිසා ගිහිව හෝ කෙසේ නමුත් බුදු සසුන රැකගත යුතු යැ යි සිතා සුදු පිළි හැඳ පෙරව, ගණින්නාන්සේලා නමින් පොත්පත්, බුදු පිළිම ආදී ආගමික පූජනීය වස්තූන් විහාරස්ථානත් රැක බලා ගනිමින් විසූහ." (ඤාණවිමල 2001)

ස්ථාන ආශ්‍රිත භෞතික උරුමය භුක්ති විඳින්නෙකු මෙන් ම රැකවලෙකු ලෙස ගණින්නාන්සේලා පෙනී සිටිමින් ඒවායේ උරුමය සපුරා වැනසෙන්නට නොදී කටයුතු කළහ. එහෙත් පුරාණ භික්ෂූන්ට සාපේක්ෂව ගණින්නාන්සේලාගේ භූමිකාව කාලීන විකෘතියකි. මෙය තත්කාලීන සමාජ, දේශපාලනික සහ සංස්කෘතික වෙනස්කම් හමුවේ එය කළමනාකරණය කරගැනීම ලෙස සැලකිය නොහැකි අතර දුර්වල අනුගත වීමක් ලෙස සැලකිය හැකි ය. එහෙත් එම පිරිසෙන් ආගමික ස්ථානවල ප්‍රතිසංස්කරණ, අලුත්වැඩියා කිරීම් හරහා අවමයෙන් හෝ කෘත්‍රිම ජීවයක් ආරක්ෂා වූයේ ය යන්න ප්‍රතික්ෂේප කළ නොහැකි ය. සමකාලීනව පැවති දේශපාලන යාන්ත්‍රණය ද, භික්ෂුත්වය ද සාපේක්ෂ අර්ථයෙන් විකෘතියක් වූවා සේ ස්ථානීය ප්‍රතිසංස්කරණ ද එම ගණයෙහිලා සැලකීමට සප්‍රමාණික සාධක පවතී. එහෙත් සමකාලීන යටත් විජිත බලධාරීන්ගේ ශාසන විරෝධී ක්‍රියාකාරකම් හමුවේ ඉතා අසරණව බුද්ධ ශාසනයේ නාමයෙන් ආගමික ස්ථානවල පැවැත්ම තහවුරු කරගැනීමට වෙර දැරූ පිරිසක් ලෙස ඇගයීමට ලක්විය යුත්තේ ඔවුන්වත් නොසිටියේ නම් කුමකින් කෙළවර වන්නට ඉඩ තිබුණි ද? යන්න සිහිකරනා විට ය. මේ පිළිබඳව සැලකිමේදී "සිය නෑදෑයන් සමග විහාර සන්තක දේ භුක්ති වින්දත් එය වැනසෙන්නට ඉඩ නොදුන් හෙයිනි අදත් ඒ

ලෙස ම පවතින්නේ" ලෙස වාචිස්සර හිමියන් (2003: 69) කරන ප්‍රකාශය සමඟ අපි එකඟ වෙමු. මෙම පිරිසේ මැදිහත්වීමෙන් එතෙක් පෝෂිතව තිබූ පුස්කොළ පොත් සම්භාරයක් බුද්ධිමය උරුමයක් ලෙස විවිධ අභියෝග මැද මතු පරපුරට දායාද කර දීම ද පැසසිය යුතු සේවාවකි.

උරුම සංරක්ෂණයට දායක වූ සමකාලීන භික්ෂූන්ට පෙර තවත් නියෝජනයක් වූයේ වැලිවිට සරණංකර සඟ රාජ හිමිගේ උපදෙස් මත එමෙන්ම කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ (ක්‍රි. ව. 1747 - 82) අනුග්‍රහය මත ක්‍රියාත්මක වූ සිල්වත් සමාගමට අයත් සාමණේරවරු ය (මල්සිරි 2011: 191). මොවුනට රාජ්‍ය අනුග්‍රහය නොඅඩුව ලැබීමෙන් ඉතිහාසයෙන් අයත් වූ විහාර ඉඩම්වල වලංගුතාව සක්‍රීය වූ අතර (එම) මොවුන් විසින් සමකාලීන සමාජ ආගමික අවශ්‍යතා අනුව ප්‍රමුඛත්වය දෙමින් ශ්‍රී මහා බෝධිය වටා පවතින දැවැන්ත ප්‍රාකාරය ඉදිකිරීම වැනි ව්‍යාපෘතිවලට මුලපුරන ලදි. ඉදිපැන්ගමුවේ සාමණේරයන් වහන්සේගේ මූලිකත්වයෙන් අනුරපුර නටබුන් විහාර ශේෂ රාශිකොට තනන ලද බෝධි ප්‍රාකාරය සමකාලීන සමාජ, ආගමික අවශ්‍යතාවකි. එහි විද්‍යාත්මක හෝ අවිද්‍යාත්මක බව කාලීන සමාජ, ආගමික සහ පාරිසරික සන්දර්භය තුළ තබා විනිශ්චය කළ යුතු වේ.

ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය කියවමින් ස්මාරක සහ ක්ෂේත්‍ර ගවේෂණයට සහ විධිමත් වාර්තාකරණයට පෙලඹීම සහ එම කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය ඉහළින්ම ලබා දෙමින් කටයුතු කිරීම, එසේම වටිනා ආගමික සංස්කෘතික ස්ථාන සහ සම්පත් ආරක්ෂාවට සහ සංරක්ෂණයට නෛතිකව සහ ප්‍රායෝගිකව පියවර ගැනීම එහි එක් අන්තයකි. කුතුහලය දනවන මහාර්ඝ කෞතුක සහ සංස්කෘතික වස්තු සිය රටවල් වෙත රැගෙන යාම ස්මාරක ක්ෂේත්‍ර සැලසුම් සහගතව විනාශ කිරීම, සිය උරුමයන් මිහිමත පැළ කරමින් දේශීය උරුමයන් අතුගා දැමීම, සංරක්ෂණය නොකර නොසලකා හැරීම, පැවති දේශීය උරුම සංරක්ෂණ යාන්ත්‍රණය සැලසුම් සහගතව අකර්මණ්‍ය කිරීම සඳහා නෛතික සහ ප්‍රායෝගික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ආදිය එහි අනෙක් අන්තයයි.

සේනක බණ්ඩාරනායක (1975: 10) නිරීක්ෂණය කරන පරිදි යටත් විජිත පාලන සමය තුළ ඉතිහාසයේ පෙර නොවූ විරූ ලෙස අගනගර, වරාය, පූජනීය ස්ථාන විනාශ කළ අතර සිතාමතා ම සැලසුම් කළ ප්‍රතිපත්ති මත පුරාවස්තු අපනයනය සිදු කරන ලදි. 16 වන සියවසේ පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට ආසියාවේ ප්‍රධාන නගරයක් මෙන් ම ශ්‍රී ලංකාවේ අගනුවරක් හා වෙළෙඳ නගරයක් වූ කෝට්ටේ කිසිදු සාධකයක් ශේෂ නොකොට විනාශ කරන ලදි. එසේ ම ආගමික ස්ථාන කොල්ල කෑම, ගිනි තැබීම් ආදි සංසිද්ධි ද වාර්තා වේ. පෘතුගීසීන්, ලන්දේසීන් සහ ඉංග්‍රීසීන් අනුගමනය කළ තවත් උපක්‍රමයක් නම් යුදමය ක්‍රියාමාර්ග තුළින් වැනසීමට වඩා ඔවුන්ට අනන්‍ය වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් පැරණි නගර තුළ සහ සංස්කෘතික මර්මස්ථාන තුළ පැළ කරමින් පැවති දේශීය අවකාශීය සන්දර්භයන් දූෂ්‍ය කරන ලදි. පැරණි මහනුවර නගරයත්, අනුරාධපුර නගරයත් තුළ පවතින යටත් විජිත වාස්තු විද්‍යාත්මක නිර්මාණ මේ සඳහා කදිම නිදසුන් ය. යටත් විජිතකරණ ක්‍රියාදාමයේ ප්‍රතිඵලයක් ලෙස දූෂ්‍ය වූ නගරයත් නව යටත් විජිතකරණ ක්‍රියාදාමය ක්‍රියාත්මක වන නූතනයේ අද්විතීය විශ්වීය උරුමයන් ලෙස උරුම ගෝලීයකරණ ක්‍රියාදාමය තුළ ජගත් උරුමයන් වීම ද තත් ක්‍රියාදාමය තුළ සාධාරණීකරණය කිරීමේ ව්‍යාපෘතියක් දැ යි කෙනෙකුට හැඟී යාම සාධාරණ ය.

දේශීය සංස්කෘතික උරුමය සම්බන්ධව පෘතුගීසීන්ගේ සහ ලන්දේසීන්ගේ ප්‍රවේශයන් සාහසික, මර්දනකාරී සහ විනාශකාරී විය. බ්‍රිතාන්‍ය ජාතීන් පෙර සඳහන් කරන ලද උභතෝකෝටික

ප්‍රවේශ මොනවට ප්‍රකට කළ බවට මූලාශ්‍රය හා සාධක බහුල ය. මෙම කටයුතු බොහෝවිට රාජ්‍ය තාන්ත්‍රික විය. 1815 මාර්තු 02 දින ප්‍රකට උඩරට ගිවිසුම (Kandyan Convention) හරහා ශ්‍රී ලංකා ද්වීපයෙහි පරිපාලන බලය බ්‍රිතාන්‍යයන් විසින් ලබාගන්නා ලදි. එම ගිවිසුමේ 05 වන වගන්තිය පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වන්නේ සමකාලීන ජන ප්‍රධානීන් තුළ දේශීය උරුමයේ ආරක්ෂාව වෙනුවෙන් වූ අපේක්ෂාවයි.

"මෙකී රටවල මුලාදෑනි සහ වැසියන් විසිනුත් අදහන්නා වූ බුද්ධ ශාසනය ද, දේවාගම ද කඩ කළ නොහැකිව පවත්වන්ට ඕනෑවා සහ එකී කටයුතු ද, සංඝයා ද, විහාරස්ථාන ද, දේවාල ද පවත්වන්ට සහ ආරක්ෂා කරන්නත් ඕනෑ ය" (විමලානන්ද 1963: 65).

උක්ත වගන්තිය බුදු දහමේ සහ විහාර දේවාලවල ආරක්ෂාවට දුන් පොරොන්දුව නායකයන් සහ සංඝයා වහන්සේ සැලකුවේ ඉතා උසස් දෙයක් ලෙසිනි. පෙර මෙන් තම ආගමත්, විහාර ඉඩමුත් දිගට ම ආරක්ෂා වේ යැයි ඔවුහු සිතූහ (විමලරත්න 1985: 214). මෙම ගිවිසුමත් සමග එතෙක් රජු සහ ආගම අතර වූ අවියෝජනීය නෛසර්ගික සබඳතාව කෘත්‍රිම බන්ධනයක් බවට පත් විය. ශ්‍රී ලාංකිකයන් බ්‍රිතාන්‍ය පරිපාලනයෙන් උරුමයේ පැවැත්ම වෙනුවෙන් යම් කාර්යභාරයක් අපේක්ෂා කළ ද ඔවුන් ඒ සඳහා පූර්ණ ලෙස වගකීමෙන් බැඳි ක්‍රියා කළ බවක් තදනන්තර ඔවුනගේ ක්‍රියාකලාපයන් තුළින් ප්‍රකට නොවේ. මෙය සිතාමතා ම සැලසුම් කරන ලද්දක් බව 1847 අප්‍රේල් 13 ග්‍රේ සාමි ආණ්ඩුකරුට යැවූ ලිපියෙන් පැහැදිලි වේ. ඔහු දන්වා එවූ පරිදි ඔවුන් යුද වැදී යටත් කරගත් සියලු ම රටවලට දුන් පොරොන්දුවලට සමාන පොරොන්දු උඩරට ගිවිසුමෙන් දුන් අතර එය එතරම් භාරධූරත්වයෙන් සලකා කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව කියවුණි (එම). බ්‍රිතාන්‍යයන් මෙරට සංස්කෘතික උරුමයේ පදනම් සාධක පිළිබඳව අනුගමනය කළ ප්‍රතිපත්ති සාම්ප්‍රදායික උරුම සංරක්ෂණ යාන්ත්‍රණයට තීරණාත්මක ලෙස අභියෝගයක් විය (රාජපක්ෂ 2010: 12). විශේෂයෙන් බ්‍රිතාන්‍ය පාලකයින් ශ්‍රී ලාංකේය උරුම සංරක්ෂණ යාන්ත්‍රණයේ ගාමක බලවේගයන් මනාව අධ්‍යයනය කර අවබෝධ කරගෙන සිටි බව 1816 ජුනි 13 වන දින බ්‍රවුන්රිග් (Brownrig) ආණ්ඩුකාර තැන විසින් යටත් විජිත ලේකම් වෙත යවන ලද ලිපියකින් පැහැදිලි වේ.

"...... මහනුවර රජු හා බුදු දහම අතර ඉතා සමීප සබඳතාවක් පවතී. ඔවුන්ගේ විශ්වාසයක් වන්නේ ආගම මගින් රට වැසියන් විදේශ ආක්‍රමණ ආදී සියලු උවදුරු වලින් ආරක්ෂා කරන බව ය".

උක්ත පසුබිම වටහා ගත් විදේශීය පාලකයන් එයට හිතාමතා ම සැලසුම් සහගතව දීර්ඝකාලීනව බලපෑම් කරන්නට විය. ටොරින්ටන් ආණ්ඩුකාර ධූරය භාර ගැනීමට පැමිණෙන විට බුදු දහම සහ රජය අතර සබඳතාව නැති කිරීමට ඔහුට උපදෙස් දුන්නේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස,

- රාජ්‍ය අනුග්‍රහය අවම වීම
- වැඩවසම් රාජකාරි ක්‍රමය නොසලකා හැරීම
- ඉඩම් රජයට අත්පත් කර ගැනීම
- පෙර සිරිතට ගරු නොකරමින් සංස්කෘතික ස්මාරක, සිරිත්විරිත් නොසලකා හැර කටයුතු කිරීම සිදු විය.

සංස්කෘතික උරුමය ආරක්ෂා කොට රැක බලා ගැනීමේ ක්‍රියාවලිය හා බැඳී තිබූ ප්‍රධාන අංගයක් වූයේ ඒ සඳහා ආදායම් උපයා ගැනීම සඳහා විහාරාරාම වෙත පැවරී තිබූ අවකාශයයි

(ගුණවර්ධන 2005: 47). ඒ අනුව ගම් බිම් කෙත්වතු, වැව්, ඇල වේලි, බදු සහ දඩ ආදායම් මාර්ග විය. සමකාලීනව (1840) බ්‍රිතාන්‍යයේ පල්ලිය සතු ඉඩම් වර්ධනය වීම වළකාලීමට ගත් මෝර්ට්මේන් නීතිය (විමලානන්ද 1963: 216) මෙන් ශ්‍රී ලාංකිකභික්ෂු ප්‍රජාවගේ බලය අවම කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ගයක් ලෙස අර්ථකථනය කිරීමට හැකිය. බ්‍රිතාන්‍ය පාලනය විසින් 1832 විහාර දේවාල ගම් පිළිබඳ කොමිසමක් හරහා හඳුන්වා දුන් ඉඩම් අයිතිය පිළිබඳ නෛතික ප්‍රතිපාදන සමග සාම්ප්‍රදායික වැඩවසම් කුල ක්‍රමය මත පදනම් වූ රාජකාරි ක්‍රමයට බලපෑම් එල්ල වන්නට විය (කරුණානන්ද 1990). එසේ ම 1840 මුඩු බිම් පනත මගින් ද පුරාණ රජවරුන්ගේ සන්නස් මගින් සිදු කළ ප්‍රදානයන්ගේ වලංගුභාවය නොසලකා හරින ලදි (විමලරත්න 1998: 231). උක්ත ගැටලුව තවත් තීව්‍ර වූයේ 1956 කුඹුරු ඉඩම් පනත (Paddy Land Act) මගිනි.

මේ සමඟ එතෙක් රාජකාරි ක්‍රමය මත විධිමත්ව ක්‍රියාත්මක වූ සේවා යම් ප්‍රමාණයකට අකර්මණ්‍ය විය. ආගමික ස්ථාන වෙත තිබුණු ආදායම් සීමා වූ අතර රාජකාරි කළවුන් ඒ සඳහා සහභාගී වීමට දැක් වූ පසුගාමී බව ප්‍රධාන ගැටලුවක් විය. 1833 දී රාජකාරි ක්‍රමය අහෝසි වීම තුළ විහාරගම්වලින් ආගමික ස්ථානයන්ට සිදුවන සේවාවන් යම්තාක් දුරකට අඩපණ විය. ඔවුන් උඩරට ගිවිසුමේ සිය වගකීමෙන් කෙතරම් ශීඝ්‍රයෙන් ඈත් වෙමින් සිටියේ ද යත් 1832 දී බ්‍රිතාන්‍ය රජයට ඉදිරිපත් කළ ලංකාව පිළිබඳ පාලන වාර්තාවෙහි මහනුවර පළාත්වල විහාර ඉඩම්වලින් ලැබෙන ආදායම සීමාකර ඉංග්‍රීසි සෙමනේරියක් පරිපෝෂණය කරගෙන යාමට නිර්දේශ කෙරිණ. 1856 අංක 10 ආඥා පනතේ ප්‍රතිඵලයක් ලෙස ඉඩම්වල විසූ අය රජයට බදු ගෙවා විහාර සේවය මග හරින ලදි. මේ සඳහා කදිම නිදසුනක් ලෙස 1939 දී අටමස්ථානාධිපති හිමියන් විසින් යටත් විජිත ලේකම් වෙත යැවූ ලිපිය දැකිවිය හැකිය. එහි සඳහන් පරිදි අටමස්ථානයේ විහාර ගම්වලින් පන්සලට කිසිදු මෙහෙයක් නොවී ය (කරුණානන්ද 1990: 102). රාජකාරි ක්‍රමය අහෝසි කිරීම පිළිබඳව බ්‍රෝහියර් දක්වන අදහස කෝල්බෲක් කොමිසමේ සහ යටත් විජිත පරිපාලනයේ තීරණය දැඩි ලෙස විවේචනය කිරීමකි.

> ‘‘මෙරට පැවති චාරිත්‍රවාරිත්‍ර සහ සම්ප්‍රදායන් පිළිබඳ කිසිම අවබෝධයක් නොතිබූ මේ කොමිසම ඒ නිසා පුද්ගලික නිදහසට යැ යි කියමින් එවකට පැවති පුද්ගලයාට වඩා රාජ්‍ය උන්නතිය වැදගත් හැටියට සලකමින් ක්‍රියාත්මක වූ රාජකාරි ක්‍රමය අහෝසි කළේ ‘රාජකාරි ක්‍රමය’ යන්නේ නියම අදහසවත් නොදැන ය’’.කසය පාවිච්චි කරමින් මෙහෙ ගනු ලැබූ ම්ලේච්ඡ ක්‍රමය සමඟ ලංකාවේ තිබූ රාජකාරි ක්‍රමය සැසඳීම අත්‍යන්තයෙන් ම සාවද්‍ය ය. රාජකාරි ක්‍රමය අහෝසි කිරීමේ නීතිය ක්‍රියාත්මක කිරීමත් සමග සෑම කෙනෙකුගේ ම වගකීමව තිබූ දෙය කිසිවකුගේ හෝ වගකීමක් නැති දෙයක් බවට පත් විය. කාර්යක්ෂම සුළුතරය, අලස බහුතරයේ අනුකම්පාව යටතට පත් විය.....(බ්‍රෝහියර් 2002: 166 - 167).

බුදු දහම, විහාර ඉඩම් සහ රාජකාරි ක්‍රමය පිළිබඳව බ්‍රිතාන්‍යයන් ගෙන ගිය බෞද්ධ විරෝධී ප්‍රතිපත්ති නොරිස්සූ යටත් විජිත නිලධාරියෙක් වූ එවකට ලංකාවේ ගණකාධිකාර ලෙස කටයුතු කළ සී. ජේ. මැකාර්ති බුදු දහම සමග සම්බන්ධය අතහැරීම සුදුසු නොවන බව පෙන්වා දුන්නේ ය (විමලරත්න 1995: 217).

ඉඩම් වගා කළවුන්ගෙන් ලබාගත් විවිධ සේවාවන් එනම් ඉඳහිට කළ සේවා (උත්සව කටයුතු, ගොඩනැගිලි නඩත්තුව), අවිච්ඡින්න සේවා (බෙර ගැසීම, ආවතේව), චාරිකා සේවා (බඩු සැපයීම), නිසා සංඝයාගේ ජීවිතයත්, බුද්ධාගමට අනුබද්ධ ආමිස පූජාත් අඛණ්ඩව කරගෙන යාමට ක්‍රමවේදයක් ද සැකසී තිබුණි. මේ අයුරින් බ්‍රිතාන්‍ය පාලකයන් විහාර දේපළ ඉඩම් රාජකාරි ක්‍රමය සම්බන්ධයෙන් විවිධ අරමුණු සහිතව අණ පනත් ඉදිරිපත් කළ ද ඒ එකදු පනතක් හෝ සාර්ථකව ක්‍රියාත්මක කළ නොහැකිව අසාර්ථක වූයේ පැවති ක්‍රමයට ආගන්තුක සහ නොගැළපුණු බැවිනි. ඔවුනගේ ප්‍රතිපත්ති සමස්ත ඉඩම් පාලනය අවුල් කළ එකක් වූ අතර එහි විපාක අදටත් අත්විඳිමින් සිටී.

උරුමයේ අයිතිකරුවෝ කවරහු ද?එහි සංරක්ෂණය කා සඳහා ද? 1815 උඩරට ගිවිසුමේ අන්තර්ගතය බ්‍රිතාන්‍යයින් විසින් සැලසුම් සහගතව කඩ කරමින් සිටිනා ආකාරය වැඩිකල් නොගොස් උඩරට නිලමේවරුන්ට සහ භික්ෂූන්ට බොහෝ දෙනෙකුට ප්‍රත්‍යක්ෂ විය.
යටත් විජිත පාලකයන්ගේ එම බුද්ධ ශාසන ආගම් විරෝධී ප්‍රතිපත්තිය නොඉවසූ දේශීයයන්ගෙන් ඒ සඳහා විරෝධතා විවිධ ස්වරූපයෙන් එල්ල වන්නට විය.1818 ඌවේ කැරැල්ල සඳහා හේතු ගණනාවක් දැක්විය හැකි නමුදු ජාතික සහ ආගමික සම්ප්‍රදායන් දේශීය පාලනය යටතේ ක්‍රමයෙන් බිඳ වැටෙනු දැකීම එම හේතු අතර එකක් වූ බව පැහැදිලි ය(ධර්මදාස1995: 240; විමලරත්න 1995: 217). 1823, 1834, 1842 සිදු වූ කුමන්ත්‍රණ සහ කැරලි ඇති වූයේ පාරම්පරික දේශපාලන ක්‍රමය, සමාජ සංස්කෘතික රටාව පුනරුත්ථාපනය කරගැනීමේ පරමාර්ථයෙනි (Mills 1935: 165). 1848 බ්‍රිතාන්‍ය රජයට විරුද්ධ කැරැල්ලට ද හේතු වූයේ උක්ත බෞද්ධ විරෝධී විහාර ඉඩම් පිළිබඳ ප්‍රතිපත්තිම ය(විමලරත්න1995: 217). මෙකී විරෝධතා හමුවේ දැඩි ප්‍රතිපත්තිවල එල්බගෙන සිටි බ්‍රිතාන්‍ය පාලනය මධ්‍යස්ථ ප්‍රතිපත්ති කෙරෙහි නම්‍යශීලී කරගැනීමට ද සමහර අවස්ථාවල හැකි විය. නිදසුනක් ලෙස1818 කැරැල්ලෙන් පසු 1815 ගිවිසුමේ වගන්ති සංශෝධනය කළ ද බෞද්ධ විහාර ඉඩම් පිළිබඳව කොන්දේසි වෙනස් නොවූ අතර, එහි 21 වැනි වගන්තියට අනුව තවදුරටත් සියලු පන්සල් ඉඩම් බදු වලින් නිදහස් කෙරිණ (එමඃ214). එසේම1818 කැරැල්ල සමයේ ලබාගත් දළදාව 1853මැය20 සිංහල ප්‍රධානයන්ට සහ භික්ෂූන්ට පවරන ලදි (එමඃ217). මේ යුගයේ භික්ෂූන් වහන්සේලා ජාතික ආගමික උරුමය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ කර්තව්‍යයන්හි නිරත වී ඇති බව පෙනේ(ධර්මදාස 1995: 245). 1848 කැරැල්ලේ දී මහනුවර ගංගාරාමයේ කුඩා රාහුල හිමියන් ද,1822–23 කැරැල්ලේ දී මහනුවර ගංගාරාමයේ උඩුවේ හිමියන් ද ප්‍රමුඛ විය. 1848 කළුතර, පානදුර, මොරටුව ප්‍රදේශවල භික්ෂූන් ක්‍රිස්තියානි ව්‍යාප්තවාදයට එරෙහිව සංවිධානය වූ අයුරු ඩික්සන් නමැති පූජකයා වාර්තා කර ඇත(එමඃ 245). මෙලෙස යටත් විජිත ප්‍රතිපත්ති වලට එරෙහිව ප්‍රබල ප්‍රතිවිරෝධයක් එල්ල වෙමින් පැවති අතර එය19 වන සියවස මැද භාගයේ දී ඇතිවූ ජාතික - ආගමික ප්‍රබෝධයක මුල් පියවරක් ද විය. මෙය පසුව නිදහස සඳහා වූ අරගලයට ද පදනම විය(Bandaranayake 1975: 11).

19 වන සියවස අගභාගය වන විට දිගින් දිගටම අරගල, උද්ඝෝෂණ කිරීම හේතු කොටගෙන බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය පරීක්ෂා කිරීම, කියවීම, ගවේෂණය, ආරක්ෂා කිරීම කෙරෙහි අවතීර්ණ වීමක් හඳුනාගත හැකි ය. මෙම හැදෑරීම ඔවුන්ගේ පාලනය පහසු

කරගැනීමේ උපක්‍රමයක් ලෙස ද සිතන්නට ඇත. ඒ අනුව යමින් දේශීය සංස්කෘතික උරුමය පිළිබඳව සංවේදීව ක්‍රියා කළ පරිපාලන නිලධාරීන් පිරිසක් 19වන සියවස අගභාගය වන විට හඳුනාගත හැකි ය. ඒ අතර හෙන්රි පාකර්, සර් ජේම්ස්. ඊ. ටෙනන්ට් (1859), එච්. සී. පී. බෙල්, මේජර් තෝමස් ස්කිනර්(1834), ඒ. ඩී. බ්‍රෝච්, ආණ්ඩුකාර හර්කියුලීස්(1871), රීස් ඩේවිඩ්ස්(1871), ආණ්ඩුකාර විලියම් ග්‍රෙගරි, ඩික්සන් ඒජන්ත(1873) හාස්මිදර් ආදීන්ගේ පර්යේෂණ ඇතුළත් මැදිහත්වීම් සහ ක්‍රියාකාරකම් ශ්‍රී ලාංකේය උරුමයේ විශිෂ්ටත්වය ලොවට ප්‍රකාශ කිරීමට හේතු විය. එහෙත් මොවුනගේ මෙම සංස්කෘතික උරුමය සමග සිදුකරන කටයුතු සඳහා එවකට යටත් විජිත අභියෝග හමුවේ සන්ධානගත වූ ජාතික ව්‍යාපාරයේ ප්‍රතිරෝධය ද එල්ල විය. එච්. සී. පී. බෙල් වැන්නවුන්ගේ ක්‍රියා කලාපයන් කෙරෙහි ජාතික ආගමික ව්‍යාපාරයේ නිරතවූවන් පැහැදීමකින් නොසිටි බව පෙනේ. මෙම තත්ත්වය වඩාත් කැපී පෙනෙන්නේ 20 වන සියවස මුල් භාගයේ ය. චෛත්‍ය ප්‍රතිසංස්කරණ සහ සංවර්ධන සමිති ජනිත වන්නේ උක්ත පසුබිම තුළ ය.19 වන සියවස අගභාගයේ දී ජාතිකත්වය, ස්වදේශීයත්වය ආදී සංකල්ප අගය කිරීම සහ ඊට තිබූ වටිනාකම පිළිබඳව පුළුල් සංවාදයක් ජාත්‍යන්තර තලයේ වූ අතර එය ලංකාව කෙරෙහි ද යොමු වී ලංකාවේ සංස්කෘතික උරුමය සොයා බැලීමේ සහ ආරක්ෂා කිරීමේ දිශානතියක් බ්‍රිතාන්‍ය පාලන සමය තුළ නිර්මාණය කළේ ය.

| වර්ෂය | පුද්ගලයින් | ක්‍රියාකාරකම් |
|---|---|---|
| | ගවේෂණාත්මක අවධිය | |
| 1817 | රැල්ෆ් බැක් හවුස් | අනුරාධපුර, පොළොන්නරු වැව් සහ නටබුන් ගොඩනැගිලි මිනුම් ලබාගැනීම |
| 1828 | ජොනතන් ෆෝබස් | ලංකාවේ බොහෝ ස්ථානවල සංචාරය කොට උරුමවල කාලීන ශේෂ තත්ත්වය වාර්තා කිරීම. |
| 1831 | මේජර් තෝමස් ස්කිනර් | අනුරාධපුර, පොළොන්නරුව පිළිබඳ වාර්තා කිරීම |
| 1832 | ජේ. ජේ. චැප්මන් | අනුරාධපුර, මිහින්තලේ නටබුන් අළලා රාජකීය ආසියාතික සංගමයට පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම |
| 1859 | එමර්සන් ටෙනන්ට් | අනුරාධපුර, පොළොන්නරුව, සීගිරිය, මිහින්තලේ, රිටිගල, අවුකන, දඹුල්ල, මාතලේ, අළු විහාරය උරුම ස්ථාන වාර්තා කිරීම |
| 1869 | එල්. ලෙයිස් වින් | වෙස්සගිරිය එළි පෙහෙළි කිරීම |
| 1871 | ලෝටන් | ආණ්ඩුකාර හර්කියුලිස් රොබින්සන්ගේ උපදෙස් මත අනුරාධපුර, පොළොන්නරු නගරයේ පුරා ස්ථාන ඡායාරූපගත කිරීම |
| 1871 | රෙයිස් ඩේවිස් | අනුරාධපුර අවට සෙල්ලිපි එකතු කරන ලදි |
| 1878 | විලියම් ග්‍රෙගරි | ගල් කණු, වෙහෙර විහාර අලුත්වැඩියාව, පුරාවිද්‍යා උරුමයට වී තිබූ විනාශය පිළිබඳ වාර්තාවක් සැකසීම සහ යටත් විජිත මහ ලේකම්ට ඉදිරිපත් කිරීම |

| | | |
|---|---|---|
| 1873 | ඩික්සන් | ථූපාරාමය, අභයගිරිය එළි පෙහෙළි කිරීම |
| 1873 - 1874 | කපිතාන් ආර්. ඊ. හෝග් | ගොඩනැගිලිවල සඳකඩ පහන්, මුරගල් ආදී මූර්ති , ඡායාරූපගත කිරීම, අනුරාධපුර නටබුන් මතු කිරීම, සෙල්ලිපි පිටපත් කිරීම |
| 1873 | ජෝන් කැෆර් | විලියම් ග්‍රෙගරි ආණ්ඩුකාර තැනගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුර නගරයේ පූර්ණ ගවේෂණයක් සිදු කිරීම |
| 1875 - 1879 | පී. ගෝල්ඩ් ස්මිත්, ම්‍යුලර්, එල්. ඩී. සොයිසා, මහා මුදලි | සෙල්ලිපි පිටපත් ගැනීම |
| 1887 | ජේ. පී. ස්මිදර් | ෆර්ගසන්ගේ නිර්දේශ මත අනුරාධපුර වඩා වැදගත් වාස්තු විද්‍යා ගොඩනැගිලි පිළිබඳ පරිමාණානුකූල සැලසුම් සහ සැකසීම |
| 1885, 1886, 1888 - 90 | බරෝස් | රාජකීය ආසියාතික සංගමයේ මඟ පෙන්වීම යටතේ මිරිසවැටි ස්තූපයේ වනාන්තර එළි කිරීම. බරෝස් විසින් කැණීමක් ඇරඹීම. ආතර් ගොඩන්ගේ උපදෙස් පරිදි අභයගිරිය සහ මිහින්තලේ ස්තූප ඉහළ කොටස් ප්‍රතිසංස්කරණය අතර කුට්ටම් පොකුණ ප්‍රතිසංස්කරණයක් සහ මිරිසවැටි ස්තූපයේ ආරක්ෂාව පිළිබඳ උනන්දු වීම |
| 1890<br><br>1900 | එච්. සී. පී. බෙල්<br><br>ඕර්ටෙල් මිචෙල් | පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව (Archaeological Survey) ආරම්භ වීම සහ විද්‍යාත්මකව විධිමත්ව ස්මාරක වාර්තාකරණය (විශේෂයෙන් මධ්‍යම සහ උතුරු මැද පළාත්වල), කැණීම්, ගවේෂණ, ලේඛනගත කිරීම් මිරිසවැටි ස්තූපය සඳහා ප්‍රතිසංස්කරණ සැලසුම් සැකසීම. |
| තහවුරු කිරීමේ අවධිය (1910 - 1940) | | |
| 1910 | එච්. සී. පී. බෙල් | ස්මාරක තහවුරු කිරීම (Consolidation) නමුත් භාවිත කළ වචනය සංරක්ෂණය (Conservation) යන්න ය. |
| 1912 | ඊ. ආර්. අයර්ටන් | විධිමත් සංරක්ෂණ කටයුතු ඇරඹීම (රත්න ප්‍රසාදය සංරක්ෂණය) |
| 1912 - 22, 1922 - 27 | ආතර් මොරිස් හොකාට් | සංරක්ෂණ කටයුතු විධිමත් ලෙස මෙහෙයවීම, කැණීමෙන් පසු සංරක්ෂණ කටයුතු අනිවාර්ය බව අවධාරණය කිරීම, සංරක්ෂණ මූලධර්ම වර්ධනය |

| | | |
|---|---|---|
| | | කිරීම, පුහුණු වාස්තුවිද්‍යා සංරක්ෂණ කටයුතු, ස්ථිර කාර්ය (කම්කරු) මණ්ඩලයක් නඩත්තු කටයුතුවල නියුක්ත කරවීම. |
| 1920 පසු | | ජාතික ව්‍යාපාරය, ප්‍රතිසංස්කරණ සමාගම්වල ක්‍රියාකාරකම්, ප්‍රතිසංස්කරණ විරෝධී ව්‍යාපාරය, නීති විරෝධී ප්‍රතිසංස්කරණ (ථූපාරාම, රුවන්වැලි සෑය) |
| අර්ථකථනාත්මක විග්‍රහාත්මක අවධිය I | | |
| 1940 - 56 | සෙනරත් පරණවිතාන | සංරක්ෂිත ස්මාරක අර්ථකථනය සඳහා පෙලගැසීම, කැණීම්, පර්යේෂණ, සංරක්ෂණ, අර්ථකථන (කුට්ටම් පොකුණ, රන්මසු උයන, මැදිරිගිරි වටදා ගේ, කණ්ථක චෛතිය, යාපන නගරය, දක්ඛිණ ස්තූපය), ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ ඇරඹීම (සුළු පරිමාණයෙන්), පුරාවස්තු ආඥා පනත 1940, රක්ෂිත ස්මාරක ප්‍රකාශයට පත්කිරීම, ප්‍රතිසංස්කරණ සඳහා මූලධර්ම ස්ථාපිත කිරීම, පැරණි ස්වරූප ආරක්ෂා කළ යුතු බව අවධාරණය කිරීම. |
| විග්‍රහාත්මක අවධිය II (1960 - 90) | | |
| | | ස්තූප ප්‍රතිසංස්කරණයේදී නව මානයක් අනුව කටයුතු කිරීම, අවසන් පෙනුම සංකේතාත්මක අරුත, සැදැහැවතුන්ගේ අවශ්‍යතාව, ගොඩනැගිලි ව්‍යුහයන් ආරක්ෂාව සඳහා පියසි, ආවරණ ඉදිකිරීම, ස්ථිර වාස්තු විද්‍යා සංරක්ෂණ අංගයන් ස්ථාපිත කිරීම, ම. ස. අ., උදාගම් සංකල්පය සහ සංස්කෘතික උරුම ස්ථාන ප්‍රතිසංස්කරණය, අධ්‍යාපන ආයතන ස්ථාපිතවීම, රෝලන්ඩ් සිල්වා, ප්‍රේමතිලක, බණ්ඩාරනායක වැනි විද්වතුන්ගේ ක්ෂේත්‍ර අර්ථකථනාත්මක පර්යේෂණ |

වගුව 1 - යටත් විජිත බ්‍රිතාන්‍ය සමය සහ පශ්චාද් යටත් විජිත සමය තුළ සංස්කෘතික උරුම සඳහා මැදිහත්වීම (ගුණවර්ධන 2005: 65 - 78)

**ජාතික ව්‍යාපාරය**

1920 ගණන්වල සිට 'ජාතික ව්‍යාපාරය' පදනම් කොට මෙරට තුළ ඇති වූ බෞද්ධ ප්‍රබෝධය නිසා සංස්කෘතික උරුමය පිළිබඳව පුළුල් සංවාදයක් ජනිත වූ අතර ඒ සඳහා පුරෝගාමීන්ගේ ප්‍රබල චෝදනාවක් වූයේ දේශීය සංස්කෘතික උරුමය කෙරෙහි යටත් විජිත පාලකයින් දැක්වූ නොසැලකීමේ සහ අවතක්සේරු කිරීමේ එමෙන් ම විනාශ කිරීමේ ප්‍රතිපත්තියයි. විශේෂයෙන් දේශීය ප්‍රජාවගේ ශුද්ධ අවකාශයන් මෙන් ම ජීවමාන සංස්කෘතික උරුම ක්ෂේත්‍ර වූ

අනුරාධපුර, මහනුවර ආදී ඓතිහාසික උරුම භූමීවල / නරගවල පැරණි ස්වාභාවික සහ සංස්කෘතික උරුමය සහ සංස්කෘතික භූ දර්ශනය පිළිබඳව සැලකිල්ලට නොගෙන බ්‍රිතාන්‍ය ජාතිකයින් විසින් භාවිත ඉදිකිරීම් සිදුකිරීමට ගත් පියවර නිසා දේශීයයන්ගෙන් ඒ සඳහා ප්‍රබල ප්‍රතිරෝධයක් එල්ල විය. 1912 දී වලිසිංහ හරිශ්චන්ද්‍ර ලියූ 'සිතියම් සහිත පුරාවිද්‍යාව' නමැති ග්‍රන්ථය මගින් යටත් විජිත ආණ්ඩුව විසින් කතෝලික ආගමික ගොඩනැගිලි, වාණිජමය ඉදිකිරීම් මගින් ඓතිහාසික සහ සාම්ප්‍රදායික බෞද්ධ ස්මාරක ගොඩනැගිලිවලින් සමන්විත සංස්කෘතික භූ දර්ශනයක් සහිත නගරවල ඇතිවන විකෘතිතා සහ වෙනස්කම් ආදිය පෙන්වා දී ඇත. මෙම යටත්විජිත රාජ්‍ය ප්‍රතිපත්තිය නිසා දේශීය සංස්කෘතික උරුමය විනාශ වීමට සහ විකෘති වීමට ප්‍රබල හේතුවක් වන බව එවකට ජාතික ව්‍යාපාරයේ පුරෝගාමීන් වූ වලිසිංහ හරිශ්චන්ද්‍ර, අනගාරික ධර්මපාල, මිගෙට්ටුවත්තේ ගුණානන්ද, හික්කඩුවේ සුමංගල වැන්නවුන් විසින් රට තුළ ප්‍රබල මතවාදයක් ප්‍රචාරය කළහ.

උරුම සංරක්ෂණය සහ මතවාදී අර්බුද

යටත්විජිත පාලනය තුළ උරුම සංරක්ෂණය උදෙසා ආයතනමය ප්‍රවේශයක් 1890 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ස්ථාපිත වීම සමග ඇරඹිණ. එහි පළමු කොමසාරිස් වූයේ එච්.සී.පී. බෙල් ය (කරුණාරත්න 1990: 4). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය (Silva 1968; Wijesekara 1990) විශාල වශයෙන් රටේ ස්මාරක සංරක්ෂණය පිළිබඳ ඉතිහාසය ද වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිය නෛතික රාමුව තුළ සිට පුරාවිද්‍යා කටයුතු කරගෙන යන ලද අතර ඒ දෙස දේශීය ප්‍රජාවගේ ප්‍රතිචාරය සුබවාදී එකක් නොවී ය. ඒ දෙස ඔවුන් බැලුවේ සැක සංකා සහිතව සහ විරෝධාකල්පයකිනි. එය පූජා භූමි ආක්‍රමණය කිරීමක් හා පුරාවස්තු විනාශ කිරීමක් ලෙස චෝදනා එල්ල විය.

රාජ්‍ය බලය භාවිත කරමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වූ අතර තත් ප්‍රයත්නයන් නොතැකූ දේශීය ප්‍රජාව ද සමිති සමාගම් හරහා සංවිධාන වී උරුම සංරක්ෂණයට පෙලඹෙන අයුරු දැකගත හැකි ය. මෙය එක් අතකට පූජනීය ශුද්ධ අවකාශය එහි උරුමයේ අයිතිය මුල්කරගෙන දෙපිරිසක් අතර ඇති වූ අරගලයකි. අටමස්ථාන කමිටුව ස්ථාපිත කිරීම බෞද්ධයින් දුටුවේ ශුද්ධ නුවර පැහැර ගැනීම උදෙසා දරන ලද ප්‍රයත්නයක් ලෙසිනි (හරිශ්චන්ද්‍ර 2001: 297). යටත් විජිත ආයතනමය ප්‍රවේශයට ප්‍රතිචාර ලෙස සංරක්ෂණ සමාගම් (Restoration Societies) හරහා දැවැන්ත ස්තූප සංරක්ෂණට පියවර ගනු ලැබී ය. ඒ වන විට නටබුන්ව පැවති ජීවමාන සම්ප්‍රදාය එතෙක් නටබුන් බව පිළිගැනීමට අකැමැති වූ දේශීයයන් විසින් දැක්වූ ප්‍රතිචාර තුළින් පෙනේ. " සිද්ධස්ථානවලට අදාළව පර්යේෂණාත්මක ගවේෂණ සඳහා ඉඩදිය හැක්කේ බෞද්ධාගම මියගිය ආගමක් නම් පමණි'' යැ යි හරිශ්චන්ද්‍ර ලිවී ය (හරිශ්චන්ද්‍ර 2001: 327). 19 වන සියවස අග භාගයේ සහ 20 වන සියවස මුල් භාගයේ මෙම දෙපිරිසේ ක්‍රියාදාමයන් සිදු වූ අතර මිහින්තලය බෞද්ධ සංගමය, රුවන්වැලි සෑ දාගැබ් සංරක්ෂණ සමිතිය (හෙට්ටිආරච්චි 1990: 59) ඉන් කීපයකි. ඉන් අනතුරුව එළඹෙන සියවසේ උරුම සංරක්ෂණයේ දිශානතිය කෙරෙහි ඒවායින් සිදු කරන ලද බලපෑම ඉතා වැදගත් වේ.

ක්‍රි. ව. 1900 යටත්විජිත පාලකයින් විසින් රාජකීය ආසියාතික සමාගමේ (Royal Asiatic Society) ඕටෙල් (Oertel) වැනි වාස්තු විද්‍යාඥයින් සහ ඉංජිනේරුවන් හරහා සැලසුම් සහගතව ආගමික අවශ්‍යතාවට උචිත ලෙස ප්‍රතිසංස්කරණයට පෙලඹිණ. එහි දී සැලකිය යුතු කරුණක් වූයේ

ඔවුන් විසින් එය භාවිත කරන බෞද්ධයින්ගේ අවශ්‍යතා සඳහා එහි බාහිර පෙනුම එහි මුල් පෙනුමට හැකිතාක් සමීප වන ලෙස ප්‍රතිසංස්කරණ සැලසුම් කිරීම ය (Oertel 1903: 9). එය සමකාලීන බෞද්ධයින්ගේ අවශ්‍යතාවට ගරු කිරීමකි.එහෙත් එම ව්‍යාපෘතිය කිසිදා නිමවූ බවක් නොපෙනේ. මෙම ක්‍රියාදාමයට සමගාමීව ප්‍රතිසංස්කරණ සමාගම් හරහා සිය කටයුතු කරගෙන ගිය දේශීය ප්‍රජාවගේ ප්‍රතිසංස්කරණ යටත් විජිත පුරාවිද්‍යා බලධාරීන් වූ බෙල් වැන්නවුන්ගේ විවේචනයට ලක් විය. ඒ කිසිදු විවේචනයකින් හෝ තත් ක්‍රියා පාලනය කළ නොහැකි වූයෙන් 1911 වන විට ථූපාරාමයත්, 1930 ගණන් වන විට රුවන්වැලි සෑයේ ප්‍රතිසංස්කරණත් බෞද්ධ ප්‍රජාව විසින් නිමවා තිබුණි (Wijesuriya 1993: 33). එම ප්‍රතිසංස්කරණ යටත්විජිත පාලකයින් ලේබල් කළේ ‘විනාශ’(Vandalism) ලෙසිනි. උක්ත ප්‍රතිසංස්කරණ මැදිහත්වීම ඔවුන් හැඳින්වූයේ ශ්‍රද්ධාවෙන් මුසපත් වූ අවිද්‍යාත්මක, කලාත්මක රුචිකත්වයක් නොමැති විනාශකාරීන්ගේ ක්‍රියාදාමයක් ලෙස ය. මේ කාලය තුළ ප්‍රතිසංස්කරණ විරෝධී ව්‍යාපාරයක් යටත් විජිත රජය ගෙන ගිය අතර ඒ හේතුවෙන් පුරාවිද්‍යා අවශ්‍යතා හා ආගමික අවශ්‍යතා අතර ගැටුමක් ඇති විය (ප්‍රනාන්දු 1990: 99).

මේ සම්බන්ධයෙන් 1930 දී රාජකීය ආසියාතික සමිතියේ ශ්‍රී ලංකා ශාඛාව අමතමින් ‘ LÄ Ecole Franchise de Extreme Orient’ආයතනයේ ප්‍රකට පුරාවිද්‍යාඥයෙකු වූ ආචාර්ය ගොලබියු (Goloubew) කරන ප්‍රකාශය උක්ත ප්‍රතිසංස්කරණ පිළිබඳව යටත් විජිත විද්වතුන්ගේ ආකල්පය මනාව ප්‍රකට කරයි (ASCAR 1931). මෙම විවේචනයන් ජෝන් රස්කින් (John Ruskin)සහ විලියම් මොරිස් (William Morris) වැනි බටහිර ආන්තික වාස්තුවිද්‍යා සංරක්ෂණවාදීන්ගේ මතවාදවල එල්බ ගත්බටහිර පාලකයන්ගේ දෘෂ්ටිකෝණයයි. විවේචනය ඉතා දැඩි වූයේ බටහිර සංරක්ෂණවාදී මිනුම් දඬු, සංකල්ප සහ ක්‍රමවේද සහිත ආකෘතියක් තුළට පෙරදිග සංරක්ෂණ ප්‍රවේශයන් බලහත්කාරයෙන් ඇතුළු කිරීමට යාමේ සාවද්‍ය ප්‍රවේශය සහ ක්‍රමවේදය නිසා විය හැකි ය. එසේ ම සමකාලීන බටහිර සංරක්ෂණ දෘෂ්ටිකෝණයේ අවශ්‍යතා සඳහා පෙරදිග රටක ජීවමාන ආගමික අවශ්‍යතා අවබෝධ කරගැනීමට නොහැකි වීම මේ තුළින් විද්‍යමාන කෙරේ. සංරක්ෂණ වෘත්තිකයින්ට උරුම සංරක්ෂණය සම්බන්ධයෙන් වර්තමානය වන තුරුත් විසඳා ගත නොහැකි අර්බුදයක ප්‍රභවය මෙහි දී හඳුනාගත හැකි ය. එනම් එකිනෙකට ප්‍රතිවිරුද්ධ ඇගයීම් සහිත බටහිර ද්‍රව්‍යාත්මක තථ්‍යතාව (Material Authenticity) පදනම් කරගත් සංරක්ෂණ විද්‍යාවේ අවශ්‍යතාත්, දේශීය ජීවමාන බෞද්ධාගමේ අවශ්‍යතාත් තුලනය කිරීමට යාම තුළ මුහුණදුන් ගැටලුවයි.

මේ වන විට හෝකාට්ගේ නායකත්වයෙන් (1922 - 26) ස්ථාවර නියෝග ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් බටහිර මූලධර්ම මත පදනම්ව ස්මාරක සංරක්ෂණ මෙහෙයුම් නිර්ණායක (Guidelines for consolidation of monuments) ද ස්ථාපිත කර තිබුණි (Wijesuriya 1993: 16).

මෙහි දී අප විසින් නැඟිය යුතු සාධාරණ ප්‍රශ්නයක් නම් උරුමයේ අයිතිකරුවෝ කවරහු ද? උරුමයේ භාරකරුවෝ කවරහු ද?උරුමයේ ප්‍රතිසංස්කරණය කා සඳහා ද? යන්නයි. බෞද්ධ ප්‍රජාවගෙන් සැදුම් ලත් ප්‍රතිසංස්කරණ සමාගම් උරුමයේ සාම්ප්‍රදායික අයිතිකරුවන් ලෙස පෙනී සිටිමින් එහි ප්‍රතිසංස්කරණ ප්‍රජාවගේ ආගමික අවශ්‍යතා සඳහා විය යුතු ය යන දැඩි මතයේ සිට ක්‍රියා කළ බව පෙනේ.

උක්ත පසුබිම තුළ යටත්විජිත පාලකයින් නෛතික ක්‍රියාමාර්ග තුළින් සිය අයිතිය සහ භාරකාරත්වය භාවිත කර උක්ත ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයන් පාලනයට අදහස් කළේ ය. නව නීතියක ප්‍රභවය මේ අයුරින් ප්‍රතිසංස්කරණ පදනම් කරගනිමින් ප්‍රභවය වූ බව පෙනේ. ඒ වන විට පැවති 1890 පුරාවස්තු ආඥා පනත (Antiquities Ordinance of 1890) තත් ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයන්ට එරෙහිව මැදිහත් වීම සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් ඉන්දියානු ආකෘතියේ නෛතික පනතක අවශ්‍යතාව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් අවධාරණය කර ඇත (ASCAR 1933). මේ සඳහා නෛතික අවශ්‍යතාව එවකට අභ්‍යන්තර කටයුතු සහ අධ්‍යාපන ඇමැතිගේ අවධානයට යොමුකර ඒ සඳහා ක්‍රියාත්මක වීමට කමිටු පත් කිරීමක් ද සිදු කළ බව සඳහන් වේ (එම). මෙහි අවසන් ඵලය වූයේ පෞද්ගලික අයිතිය සහ කිරීටය සතු භූමිවල පවත්නා ස්මාරක ප්‍රතිසංස්කරණ පාලනය කිරීම අරමුණු කර ස්ථාපිත කළ1940 පුරාවස්තු ආඥා පනතේ ප්‍රභවයයි (ASCAR 1940 - 45).

දේශීය සන්දර්භයක් තුළ බටහිර පදනමීය රාමුවේ වලංගුභාවය මෙහි දී දේශීය ජාතිකයන් විසින් ප්‍රශ්න කරන ලදි. මෙය දේශීය සංයුක්ත ප්‍රතිපත්තියකට වඩා වියුක්ත ප්‍රතිපත්තියකි. එහෙත් මෙම ක්‍රියාදාමයන් තත්කාලීන දේශීය බෞද්ධ ප්‍රජා අවශ්‍යතා ස්පර්ශ කිරීමකට වඩා වෘත්තිකයන්ගේ අවශ්‍යතා ඉටු කිරීම අරමුණු කරගත් විට ජනතාවගෙන් ප්‍රතික්ෂේප වීම දැකගත හැකි ය. මෙහි දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව බෙල්, අයර්ටන්, හෝකාට්වැන්නවුන්ගේ ප්‍රධානත්වයෙන් වෘත්තිකයන්ගේ සහභාගීත්වයෙන් විධිමත් ගවේෂණ, කැණීම් සහ සංරක්ෂණ ක්‍රියාත්මක කරමින් සිටි අතර ප්‍රතිසංස්කරණ සඳහා යොමු නොවී ය (Wijesuriya 1993: 16 -17). මේ අවස්ථාව වනවිට උරුමය එහි ප්‍රජාව අතර පැවති සබඳතාව අතීතයට සාපේක්ෂව තරමක් දුර්වලව තිබූ නමුත් ජාතික ව්‍යාපාර, ආගමික පුනරුද හරහා එය නැවතත් ශක්තිමත් වෙමින් පැවතිණ. මේ අවස්ථාවේ ප්‍රජාව සහ උරුමය අතර සබඳතාවට විදේශීය වෘත්තිකයින් ආදේශ කරන ලදි. ප්‍රජාව සහ උරුමය අතර සබඳතාව ශක්තිමත් කිරීමට නොහැකි වූ දේශීයයන්ට ඔවුන්ගේ බටහිර මූලධර්ම පදනමීය විද්‍යාත්මක සංරක්ෂණ ආගන්තුක වූවක් විය.

1940 දී පුරාවස්තු ආඥා පනත ස්ථාපිත කිරීමත් සමග එතෙක් විදේශීය වෘත්තිකයින් අත පැවති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධිපතිත්වය ප්‍රථම වතාවට ශ්‍රී ලාංකිකයෙකු අතට පත්වන්නේ සෙනරත් පරණවිතාන පුරාවිද්‍යා කොමසාරිස් ධුරයට පත්වීමත් සමග ය. විදේශීය වෘත්තිකයින් හරහා තමන්ට ඉටු කරගත නොහැකි වූ කාර්ය දේශීය වෘත්තිමය නායකත්වයක් හරහා ඉටු කරගැනීමට යටත් විජිත පාලනයේ අවසන් භාගයේ තිබූ අපේක්ෂාව විය හැකි ය. ඔහුගේ සංරක්ෂණ ප්‍රතිපත්ති දෙස බලන කල එය බටහිර සංරක්ෂණ විද්‍යාවේ මූලධර්ම මත ක්‍රියාත්මක වූවක් බව ද පැහැදිලි ය. අර්ථකථනයට මුල් තැනක් දුන් ඔහු පුරාවිද්‍යා උරුමය රැකගැනීමේ දී කිසියම් උරුම වස්තුවක පෞරාණිකත්වය විනාශ වන නවීකරණ කටයුතු සම්බන්ධ කර එහි පැරණි ආකෘතිය වෙනස් නොකළ යුතු ය යන්න මූලධර්මයක් ලෙස අනුගමනය කළේ ය. මොහුගේ ප්‍රතිපත්ති සහ ක්‍රියාකාරකම් යාපහු නගරය, නිල්ලග්ගම බෝධිඝරය, මැදිරිගිරි, වටදා ගෙය, රන්මසු උයන, කුට්ටම් පොකුණ, අනුරාධපුර, පොළොන්නරුව, සීගිරිය නගර තුළ සිදු කළ සංරක්ෂණ කටයුතුවලින් මනාව ප්‍රකට වේ. ප්‍රනාන්දු (1990) සඳහන් කරන පරිදි,

“පරණවිතාන මහතාගේ කාලයේ තැහැවිරීම් කරන ලද්දේ කිසිම අලුත්වැඩියාවක් නොකරන ලද සේ පෙනීමට සහ එහි ඇත්තේ මුලින් තිබූ කර්මාන්තය යැ යි යන හැඟීම දීමට ය” (ප්‍රනාන්දු 1990: 100).

**පශ්චාද් යටත් විජිත අවධිය**

1948 දී යටත් විජිත පාලනයෙන් නිදහස ලැබුව ද යටත් විජිත සංරක්‍ෂණ ප්‍රවේශවලින් මිදීමට දේශීය වෘත්තිකයින්ට නොහැකි විය. එයට හේතුව බටහිර අධ්‍යාපනය හරහා ශික්‍ෂණය පුහුණු කළ දේශීය වෘත්තිකයින් විසින් ම තත් කටයුතු මෙහෙයවීම ය. විජේසූරිය (1993: 18) වර්ගීකරණය කරන පරිදි පුරාවිද්‍යා ඉතිහාසයේ දෙවන අර්ථකථනාත්මක අවධියක් ලෙස හඳුනාගන්නා වූ 1960 - 1990 කාල පරාසය මෙම පර්යේෂණයට බඳුන් වන ජගත් උරුම නගර දෙක සම්බන්ධයෙන් විශේෂයෙන් වැදගත් වේ. වර්තමානයේ අප මුහුණ දෙන්නා වූ උරුම සංරක්‍ෂණයේ අර්බුදය මෙම කාල සීමාව දක්වා කෙසේ පැමිණියේ ද යන්න වටහා ගැනීම වැදගත් වේ. පශ්චාද් නිදහස් ශ්‍රී ලංකාවේ ඇතිවන සමාජ, දේශපාලනික වාතාවරණය තුළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ජනතා අවශ්‍යතා සඳහා තවදුරටත් පිටුපා සිටිය නොහැකි විය. යටත්විජිත අවධිය තුළ දේශීය උරුමය විවිධ අභියෝගවලට මුහුණ දුන් අතර ඉන් මිදුණු පසු ජනතාවගේ පීඩනය විසින් ජනතාවගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන්ට සාම්ප්‍රදායික ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයන් සඳහා බල කෙරිණ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තු නායකත්වය 1957 දී ගොඩකුඹුරේ බාරගත් අතර ඒ වන විට ඔහුගේ ආකල්ප සහ ප්‍රතිපත්ති බොහෝ දුරට ජනතා අවශ්‍යතා ඉටු කිරීම කෙරෙහි යොමු වී තිබිණ.

> “අප රටේ පැරණි ස්ථාන බොහොමයක් මහජනතාවගෙන් වැඩි කොටසක ආගම හා බැඳී පවතින හෙයින් ඒ පිළිබඳ පුරාවිද්‍යා කටයුතු කිරීමේ දී විද්‍යාවේ පමණක් නොව ආගමේ ද අවශ්‍යතාව සිහි තබාගෙන කටයුතු කළ යුතු වෙනවා ය”(ASCAR 1961 / 62: 233).

උක්ත ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ විද්‍යාවේ අවශ්‍යතා සහ ආගමේ අවශ්‍යතා තුලනයක අවශ්‍යතාවයි. අනාගතයේ එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක වනු දැක්මේ අපේක්‍ෂාවෙන් ගොඩකුඹුරේ පසු වූ බව පෙනේ.

උක්ත ප්‍රතිපත්ති තුළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ස්මාරක ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රතිසංස්කරණ පාලනය කිරීමේ අරමුණින් නිර්මිත නෛතික රාමුව තුළ සිට ම ප්‍රවේශ වීම දැකගත හැකි ය. මෙය ජනතා / ප්‍රජා අවශ්‍යතා වෙනුවෙන් නීතිය නම්‍යශීලී කරගැනීමකි. මෙම අවස්ථාව ‘උරුමය ප්‍රජාව සඳහා ය’ යන ප්‍රතිපත්තිය ප්‍රමුඛ වූ අවශ්‍යතාවක් ලෙස සඳහන් කළ හැකි ය. මේ අවධියේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තු වෘත්තිකයින්, එසේම ආගමික බලධාරීන් සහ උපදේශක මණ්ඩලය ඔස්සේ ප්‍රතිසංස්කරණ සැලසුම් සැකසුණු අතර එම සැලසුම්වල ප්‍රධාන අරමුණ වූයේ තත් ආගමික ස්ථාන විශේෂයෙන් ම ස්තූපවල ආගමික වැදගත්කම සහ උපයෝගීතාවේ අගයයි (Wijesuriya 2005:41). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අනුගමනය කළ මෙම සංස්කෘතික අගය පදනම සහ උපයෝගීතා පදනම යටත් විජිත සහ බටහිර පදනමීය සම්ප්‍රදාය යම් ප්‍රමාණයකට වියුක්ත කිරීමෙහිලා සමත් විය. මෙය යම් ප්‍රමාණයකට සාම්ප්‍රදායික සංරක්‍ෂණ ඇගයීම් පදනම හා සංවේදී වීමකි. මෙම ප්‍රතිසංස්කරණයන්හි දී හුදෙක් ද්‍රව්‍යාත්මක ශේෂ ආරක්‍ෂා කිරීමකට වඩා ඒවායේ පරිපූර්ණත්වය, හැඩය යළි උදා කිරීම තුළින් ඊට අනුබද්ධ සංකේතාත්මක අරුත පෙන්වීමට ප්‍රයත්න

දරන ලදි. මේ කර්තව්‍යය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ඒ වන විට පැවති නෛතික රාමුව තුළින් අවශ්‍ය පරිදි මූලධර්ම සකසා ගන්නා ලද අතර ඒ තුළ ද බටහිර ප්‍රතිසංස්කරණ සංකල්පයේ මූල බීජ පදනම් වී ඇතත් එම මූලධර්ම ස්මාරක බද්ධ ජීවී ගුණය යළි පිබිදවීම සඳහා දිශානතියක් නිර්මාණය කර ඇති බව පෙනේ.

- පුරාවිද්‍යා දත්ත සහ අදාළ දත්ත සමග ප්‍රතිසංස්කරණ සැලසුම් සැකසීම.
- උපකල්පන පිළිගැනීම.
- සියලු මැදිහත්වීම් පිළිබඳ සවිස්තර වාර්තා තැබීම.
- අභ්‍යන්තර ආරක්ෂා කිරීම පිණිස මෑත කාලීනම ඓතිහාසික අවධිය තෝරා ගැනීම (ඇතැම් පූර්ව අවධි ප්‍රදර්ශනය).
- තෝරාගත් පදනමකින් ස්තූප ප්‍රතිසංස්කරණය.
- සමකාලීන මුද්‍රාව සහිතව නව ද්‍රව්‍ය පැරණි ඒවායේ ප්‍රමාණවලට අනුකූලව භාවිත කිරීම.
- පැරණි ද්‍රව්‍යවලට අවම හානියක් වන පරිදි කටයුතු කිරීම.
- නූතන ද්‍රව්‍ය සහ තාක්ෂණය භාවිතය දිරිගැන්වීම.

(Wijesuriya 2005: 41).

උක්ත මූලධර්ම පදනම්ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සිදු කළ ප්‍රතිසංස්කරණ සඳහා කතරගම කිරිවෙහෙර, යටාල ස්තූපය, සඳගිරි ස්තූපය, දෙමටමල් විහාර ස්තූපය වැනි ස්තූප නිදසුන් ලෙස දැක්විය හැකි ය (Wijesuriya 1993: 45 - 56).

1970 සහ 80 දශක වන විට ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යා උරුම සංරක්ෂණ සම්බන්ධයෙන් වූ ස්ථාවරය ඒ අනුව බුදු දහම ජීවමාන ආගමක් වන හෙයින් එහි අඛණ්ඩත්වය තහවුරු වන පරිදි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම ය. වෘත්තිකයින්ගේ කාර්යභාරය ඒ සඳහා ක්‍රියා කිරීම ය.

1980 දශකය තුළ ජගත් උරුම සංකල්පය හරහා මධ්‍යම සංස්කෘතික අරමුදලත්, සංස්කෘතික ත්‍රිකෝණ ක්‍රියාවලියත් සන්දර්භගත කළ යුත්තේ උක්ත පසුබිම තුළ ය. පසුගිය දශකත්‍රය තුළ සංස්කෘතික ත්‍රිකෝණයේ ජගත් උරුමස්ථාන කෙතෙක් දුරට උක්ත අරමුණු මුදුන් පමුණුවා ගැනීම උදෙසා ක්‍රියාකර තිබේ ද? යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. ඒ අනුව සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය අහඹුවක් නොව කාලීන ජාතික, ආගමික අවශ්‍යතාවක් උදෙසා නිර්මාණය වූවක් බව පැහැදිලි ය. දේශීය උරුමස්ථාන සම්බන්ධ මෙම ජාතික, ආගමික අවශ්‍යතාව සමකාලීන උරුමය, සංරක්ෂණ සංකල්ප, ගෝලීයකරණ චල්‍යතා හමුවේ හැසිරීම තුළ දේශීය උරුම සංරක්ෂණයේ දිශානතිය කෙතෙක් දුරට ප්‍රජා අවශ්‍යතා සහ යහසාධනය කෙරෙහි සංවේදී වී තිබේ ද? යන්න විමසා බැලිය යුතු ය. දේශීය සන්දර්භය තුළ නූතන උරුම සංරක්ෂණ ක්‍රමවේදයන්හි අර්බුදයක් නැතැ යි කිව නොහැකි ය. යටත් විජිත පාලනය ක්‍රමය ඒ රටවලට අභිමි වූ විට ඔවුන් විසින් තත් රාජ්‍ය ඔවුනගේ ක්‍රමය තුළ ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගයක් ඔවුන් විසින් ක්‍රියාත්මක කරන්නට විය. සංචාරක ව්‍යාපාරය තුළ සත්කාරක ආගන්තුක සබඳතාව, යැපීම් සබඳතාව, සූරා කෑම සංකල්පමය ආධිපත්‍යය විමසා බලන විට ඒ බව පැහැදිලි ය.

1970 දශකයේ සිට සංචාරක ව්‍යාපාරය නව අධිරාජ්‍යවාදයක් (New form of Imperialism) ලෙස විද්වතුන් අතර සාකච්ඡා විය (Turner and Nash 1975: Nash 1977). එසේම රොබින්ස් (Robins 1997) විස්තර කරන පරිදි ගෝලීයකරණය සමග ජාතික රාජ්‍යවල හා ප්‍රජාව සතුව පැවති විවිධ සීමා සහ ව්‍යූහ යම් ආකාරයකට දියවීමකට ලක් විය. එබැවින් ජගත් උරුමය, ජාත්‍යන්තර ප්‍රඥප්ති මෙන් ම පදනමීය සංරක්ෂණ සංකල්ප තුළ පවත්නා දේශපාලනය කෙරෙහි ද අපගේ අවධානය යොමු කළ යුතු වේ.

අසහාය නායකත්වයෙන් දේශීය චින්තනය, සිංහල බෞද්ධ අනන්‍යතාව (Sinhalease – Budddhist identity) වැනි ප්‍රවණතා තුළ සංස්කෘතික උරුමයන්ට සුවිශේෂත්වයක් හිමි ය. 1956 දී සිදු වූ දෙදහස් පන්සිය වැනි බුද්ධ ජයන්ති අනුස්මරණය වැනි සිදුවීම් ඔස්සේ සිංහල - බෞද්ධ ජාතිකවාදය (Sinhalease - Buddhist nationalism) වර්ධනයට මග පෑදුණි. මීට සමගාමීව පූජනීය ස්මාරක ප්‍රතිසංස්කරණය, සිංහල අනන්‍යතාව ප්‍රතිනිර්මාණය කිරීමක් ලෙස සලකන ලදි.

පශ්චාද් යටත් විජිත යුගයේ ආරම්භයේ දී එනම් 1948 - 1956 කාල පරාසය තුළ ශ්‍රී ලංකාවේ පාලනයට පත් වූ දේශපාලන නායකත්වයන් බ්‍රිතාන්‍ය අධ්‍යාපනයෙන්, ක්‍රිස්තියානි ආගමෙන් ලද ආභාසයන් හරහා අගයන්ගෙන්, ආකල්පයන්ගෙන් සහ දැක්මෙන් බටහිරකරණයට ලක් වූවන් විය. එහෙයින් 1948 - 1956 කාල පරාසය හුදෙක් යටත් විජිත ශ්‍රී විභූතිය (Legacy) අඛණ්ඩව ගෙන ගිය අවධියක් ලෙස හඳුන්වා දෙනු ලැබේ (Berchert 1978; Singer 1964; Ponnambalam 1980). මෙම කාලය තුළ දේශපාලනඥයින් වූ ඩී. එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක, සර් ජෝන් කොතලාවල වැන්නන් එවකට මතුවෙමින් පැවති සිංහල බෞද්ධ මතවාදයන්ට දැක් වූ අශුභවාදී, අහිතකර ප්‍රතිචාර හේතුවෙන් එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායකට සිංහල බෞද්ධ ජාතිවාදය සඳහා අවකාශයක් නිර්මාණය විය. නිදහස් රාජ්‍ය තුළින් සිංහල බෞද්ධ අනන්‍යතා සහ සංස්කෘතික අපේක්ෂා සඳහා යහපත් ප්‍රතිචාරයක් දක්වතැ යි බලාපොරොත්තු වූව ද එවක එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව දේශීය ආහාර නිෂ්පාදනයක්, ස්වයංපෝෂිත බවක් අපේක්ෂාවෙන් නිදහස් ආර්ථික ජාතිකවාදයක් විශ්වාස කරමින් කටයුතු කළේය.

ශ්‍රී ලංකාවේ පශ්චාද් යටත් විජිත රාජ්‍යය නූතන බටහිර ආකෘතියේ උරුම සංරක්ෂණ සහ කළමනාකරණ ආකෘතියට සමගාමීව දේශීය උරුම සංරක්ෂණ ක්‍රමවේද මෙහෙයවීමේ දී තීරණාත්මක පිළිවෙතක් අනුගමනය කර ඇති බව පෙනේ. දේශීය සම්ප්‍රදායට ගරු කරමින්, එය ප්‍රතිනිර්මාණයට මූලිකත්වය දෙමින් කටයුතු කිරීම රාජ්‍යයේ ආධිපත්‍යය පවත්වා ගැනීම සඳහා තීරණාත්මක සාධකයක් විය. නිදහසට පෙර එනම් යටත් විජිත යුගයේ පාලකයා විදේශීය යුරෝපීය ජාතිකයන් වූ අතර පාලිතයා දේශීය ප්‍රජාව විය. නිදහසින් පසු උක්ත දෙපාර්ශ්වය ම නියෝජනය කළේ ශ්‍රී ලාංකේය ප්‍රජාවයි. කෙසේ වෙතත් 1948 න් පසුව යටත්විජිත යුරෝපීය පාලකයින්ගේ බලය විතැන් වූයේ යටත් විජිතකරණයට පත් වූ ප්‍රභූ පැළැන්තියට ය. මේ නිසා ම නව රාජ්‍යයට ජාත්‍යන්තර දේශපාලනික සහ ආර්ථික ප්‍රවණතාවන්ට ප්‍රතිරෝධයක් එල්ල කිරීමට නොහැකි විය (Hennayake 2006). එසේ ම ඔවුනගේ දේශීය ප්‍රජා අවශ්‍යතාවක් වූ දේශීය අනන්‍යතාව, අතීත ශ්‍රී විභූතිය සහ ආගමික අගයන් ප්‍රතිනිර්මාණයට බැඳී සිටියේය. උරුම සංරක්ෂණය පිළිබඳව දේශීය අදහස් ක්‍රියාවට නැගීම තුළ, දේශපාලනමය වටිනාකමක් පවත්නා බව දේශපාලන ප්‍රභූන් විසින් අවබෝධ කරගනු ලැබ තිබුණි. මේ අනුව පශ්චාද් යටත් විජිත ලංකාවේ ද පාලකයා සහ පාලිතයා අතර සබඳතාව

දේශපාලන සහ සංස්කෘතික සංවේදීත්වය අතර සබඳතාවක් ජනිත කළේ ය. මේ අනුව සංස්කෘතිකමය කාරණයක් වූ දේශීය උරුමය පිළිබඳ ආඛ්‍යානය පශ්චාද් යටත් විජිත ශ්‍රී ලංකාවේ අතිශයින් වැදගත් වූ දේශපාලනමය කාරණයක් විය. විශේෂයෙන් එක්දහස් නවසිය පනස් හයේ සිදු වූ දේශපාලනමය වෙනසත් සමග දේශීය අදහස් ප්‍රවර්ධනය කිරීම දේශපාලනමය වශයෙන් වැදගත් විය. මෙහි දී එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායකගේ මෙකී පසුබිම තුළ පැවති රජයට සිංහල බෞද්ධ විරෝධයක් එල්ල විය. මෙය පැරණි සංස්කෘතික අගයන්, අනන්‍යතා පදනම් කරගත් සමාජය ප්‍රතිෂ්ඨාපනය කිරීමට රජයට එරෙහි අරගලයක් විය. මේ තත්ත්වය උදා වන්නේ එවක රජයේ දේශපාලන නායකත්වයට ප්‍රජාව අපේක්ෂා කළ දේ ඉටු කරමින් නිදහස අර්ථවත් කිරීමට නොහැකි වීම හේතුකොටගෙන ය.

එක්දහස් නවසිය පනස් හයේ බණ්ඩාරනායක ආගමනය එතෙක් අඛණ්ඩව පැමිණි යටත්විජිත සංස්කෘතිය මඟින් අවතක්සේරු කළ පශ්චාද් යටත්විජිත අනන්‍යතාව යළි ස්ථාපිත කිරීමේ දැවැන්ත ඓතිහාසික ව්‍යාපෘතියක් මෙන්ම සමාජ පරිවර්තන රැසකට ද හේතු විය. 1956 මෙම වෙනසත් සමග ප්‍රථම නිදහස් ව්‍යාපාරයක් වූ සිංහල බෞද්ධ විඥානය ඉතා ශක්තිමත් ආඛ්‍යානයක් බවට පත් වෙමින් නව සමාජ රටාවකට පදනම සකස් කළේ ය. සිංහල බෞද්ධ ජන පදනම ජන බලවේගයක් වූ බැවින් ඔවුනගේ ද්‍රව්‍යාත්මක, සංස්කෘතික මෙන්ම මතවාදාත්මක අවශ්‍යතා ඉටු කිරීමට යොමු විය. මෙම ක්‍රියාදාමයන් හරහා අතීතය සහ වර්තමානය අතර සබඳතාව නිර්මාණය විය. එය අතීත ශ්‍රී විභූතිය වර්තමානය සඳහා ගැළපීමක් විය.

විවෘත ආර්ථික ක්‍රමය තුළ සංස්කෘතික උරුමයන් උපයෝගී කර ගනිමින් සංචාරක ව්‍යාපාරය මඟින් සංවර්ධනය ළඟා කරගත හැකි ය යන ආර්ථිකමය සාධාරණීකරණය ද හඳුන්වා දුනි. මෙම සංචාරක ව්‍යාපාරය තුළින් අතීත ශ්‍රී විභූතියේ නෂ්ටාවශේෂ ප්‍රතිනිර්මාණය ඔස්සේ සංවර්ධනයත් මුදුන් පමුණුවා ගත හැකි ය යන්න ජනතාවට පසක් කර දීමට ප්‍රයත්න දරන ලදි. එම සාධාරණීකරණය හරහා ගෝලීයකරණ ක්‍රියාදාමයේ මෙන් ම නව යටත් විජිතවාදයේ ප්‍රතිඵලයක් වන ජගත් උරුම සංකල්පය උරුම සංචාරණය වැනි ක්‍රියාදාමයන් ද ග්‍රාමීය ජන මනසට අභ්‍යන්තරීකරණය ඉතා සූක්ෂ්මව සිදුකරන ලදි.

දේශීයත්වයට නැඹුරු වූ සංවර්ධන ප්‍රතිපත්ති, සැලසුම් සහ ව්‍යාපෘති 1977 න් පසු ඉතා විප්ලවකාරී ආර්ථික වෙනස්කම් සිදු වූ විට දී පවා දැකගත හැකි ය. 1977 න් පසු රජයන් දේශීයත්වයට සමීප වීම, ඒ අනුව කටයුතු කිරීම, එය සංරක්ෂණයට පෙලඹීම හඳුනාගත හැකි ය. මෙය හුදෙක්,

- නිදහස් ආර්ථික ප්‍රතිපත්ති සාධාරණීකරණය
- දේශපාලන ආධිපත්‍ය තහවුරු කරගැනීම
- ධනවාදී අර්ථ ක්‍රමය ග්‍රාමීය ජන විඥානයේ අභ්‍යන්තරීකරණය කිරීම
- ගෝලීයකරණ නව යටත්විජිතවාදී සංකල්ප ජන විඥානයට සාධාරණීකරණය කිරීම

වැනි දේශපාලන පරමාර්ථ උදෙසා භාවිත කරන ලදි. අතීත ශ්‍රී විභූති යළි ස්මරණය කරමින් වප් මඟුල වැනි කෘෂිකාර්මික උත්සව සැමරීම, සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය හරහා ඓතිහාසික නගර සංරක්ෂණයට සහ ප්‍රතිසංස්කරණයට කටයුතු කිරීම සිදු විය.

සංවර්ධනය සඳහා සංස්කෘතික උරුම ඉතා විශිෂ්ට අයුරින් සම්බන්ධ කිරීම 1977න් පසු කාලය තුළ දැකගත හැකි ය. සංවර්ධන ප්‍රතිපත්ති ඉතා පැහැදිලිව බටහිර ධනවාදී සංකල්ප මත පදනම් වන විට එම සංවර්ධනයේ අවසන් පරමාර්ථය අතීත ශ්‍රී විභූතිය නැවත උදා කිරීම බව පෙන්වා ඒත්තු ගන්වන ලදි.

එසේ ම ඓතිහාසික වශයෙන් තීරණාත්මක ව්‍යුහාත්මක ආර්ථික පරිවර්තනයක් වූ විවෘත ආර්ථික ප්‍රවේශය ක්‍රියාවට නැගීමේ දී දේශපාලන නායකත්වයේ බල අධිකාරිය සාධාරණීකරණය කරමින් ඒ හරහා ප්‍රජා මනසට ධනවාදී / අධිරාජ්‍යවාදී සංවර්ධන ප්‍රවේශ අභ්‍යන්තරීකරණය කළ යුතු විය. ඒ අරමුණ සහිතව ම උපාය මාර්ගිකව සැලසුම් කළ සංවර්ධන ව්‍යාපෘතීන්ට නිදසුනක් ලෙස ආගමික ස්ථාන බද්ධ චාරිත්‍රවාරිත්‍ර පෙර සිරිත් පුනර්ජීවනය උදෙසා උරුම ක්ෂේත්‍ර සංරක්ෂණය සහ සංවර්ධනය සංස්කෘතික ත්‍රිකෝණය සහ පූජා නගර සංවර්ධනය හරහා කටයුතු කිරීම පෙන්වා දීමට පුළුවන. එම ව්‍යාපෘති සඳහා තෝරාගන්නා ලද්දේ ශ්‍රී ලාංකේය ආගමික සහ සංස්කෘතියක සම්ප්‍රදායන් සම්බන්ධයෙන් අග්‍රගණ්‍ය ක්ෂේත්‍රයන් ය. ශ්‍රී ලාංකේය ජන දිවියේ ආගමික සිරිත් විරිත් සහ නෛසර්ගිකව බද්ධ වූ ක්ෂේත්‍රයන් (අනුරාධපුර, පොළොන්නරුව, මහනුවර) සංරක්ෂණය සහ සංවර්ධනය ජන මනසේ අවධානය ආකර්ෂණය කර ගැනීමට සමත් විය. මේ හා බද්ධ වූ සංස්කෘතික දේශපාලනය (Cultural Politics) තුළ දේශපාලන චරිත සහ ආයතන සංස්කෘතික සම්පත් පදනම් කරගනිමින් ක්‍රියාත්මක විය. ජේ. ආර්. ජයවර්ධන ජනාධිපති 1977 ඔහුගේ පළමු පාර්ලිමේන්තු ආමන්ත්‍රණයේ දී ම ධර්මිෂ්ඨ සමාජය ප්‍රකාශයට පත් කළේ ය. එක්දහස් නවසිය හැත්තෑ හතේදි ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා විසින් 'ධර්මිෂ්ඨ සමාජය' (a righteous society) ප්‍රකාශයට පත් කිරීම ධර්මය පදනම් කරගත් සමාජයක් ස්ථාපිත කිරීම අරමුණු කරගත් අතර ඒ සඳහා ආගමික සිරිත්විරිත් වැදගත් වන හෙයින් ආගමික ක්ෂේත්‍ර සංරක්ෂණය කර ඒ සඳහා භෞතික අවකාශයක් රට මැද නිර්මාණය කිරීමක් ලෙස සංස්කෘතික ත්‍රිකෝණය සන්දර්භගත කළ හැකි ය. එය ධර්මිෂ්ඨ සමාජයක් ස්ථාපිත කිරීමේ දීර්ඝ කාලීන ක්‍රියාවලිය අර්ථවත් කිරීමක් ද විය. අතීත රාජ්‍ය පාලන සහ ආගමික මධ්‍යස්ථානයන් ප්‍රතිසංස්කරණය හරහා ප්‍රජා සංස්කෘතික සංවේදීත්වය දේශපාලන නායකත්වය වෙත යොමු විය.

ධර්මිෂ්ඨ සමාජ සංකල්පය හරහා ධර්මය පදනම් කරගත් සිරිත් විරිත්වලින් සමන්විත පිරිසිදු රාජ්‍යයක් බිහි කිරීම අරමුණු කරගැනුණි. ජනාධිපතිවරයා බුදු දහමේ ආරක්ෂකයා ලෙස ප්‍රකාශ කරගන්නා ලද අතර ඒ ඔස්සේ පැරණි ශ්‍රී ලංකාවේ පාලකයා සහ බුදු දහම අතර වූ සබඳතාව යළි ස්ථාපිත කළේ ය. ජනාධිපතිවරයාගේ ලාංඡනය ධර්ම චක්‍රය වූ අතර පළමු වරට බෞද්ධ කටයුතු අමාත්‍යාංශයක් ද ස්ථාපිත කළේ ය. එසේ ම බුදු දහමට ව්‍යවස්ථා තුළ නිසි තැන ලබාදෙන ලදි.

අධිරාජ්‍යවාදී නවීකරණ චින්තනය සහ අතීත ශ්‍රී විභූතිය ප්‍රතිනිර්මාණය කිරීම එක්තරා ආකාරයකට බැලූ බැල්මට විසටනාත්මක සේ පෙනුණ ද එය ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ1977 න් පසු දේශීය උරුම සංරක්ෂණය සහ බටහිර උරුම සංරක්ෂණය අතර පවත්නා සීමා යම් ආකාරයකට සම්මිශ්‍රණය, සංස්කෘතික / උරුම සංචාරක ව්‍යාපාරය සහ ජගත් උරුම සංකල්ප හරහා සාධාරණීකරණය කරන ලදි. බටහිර තථ්‍යතා සංකල්පය පදනම් කරගත් ද්‍රව්‍යාත්මක සංරක්ෂණ ප්‍රවේශයත්, දේශීය ජීවමාන උරුම සංරක්ෂණයත් අතර සුසංයෝගයක් සහ තුලනයක් මුදුන් පමුණුවා

ගැනීම අරමුණු කර ගනිමින් ව්‍යාපෘති දියත් විය. මෙම ප්‍රවේශය සංස්කෘතික විවේචනයක් සඳහා වන අවකාශය අවම කිරීමට සමත් විය.

සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතිය ඔස්සේ ඓතිහාසික, සංස්කෘතික සාම්ප්‍රදායික සිංහලයින්ගේ හදවත බඳු කලාපය (Traditional Heartland) නූතන පෘථුල ව්‍යාපෘතියක් ලෙස එනම් එය නූතන මහා පරිමාණ උරුම සංරක්ෂණ ප්‍රවේශයක් සහිත ව්‍යාපෘතියක් ලෙස සංකල්පගත කළ හැකි ය. සංස්කෘතික සම්ප්‍රදාය, දේශපාලනය සහ සංවර්ධනය ආදී සංකල්පයන් මෙම ත්‍රිකෝණ සංකල්පය තුළ ගැබ්ව ඇත. ඇතැම්හු මෙය සිංහල බෞද්ධ ජාතිවාදී කුමන්ත්‍රණයක් ලෙස හැඳින්වීමට පෙළඹුණහ.

එක්දහස් නවසිය හැත්තෑ හතෙන් පසු බිහිවන නව රජයේ අග්‍රාමාත්‍යවරයා, 1982 න් පසුව ශ්‍රී ලංකා ජනාධිපති වූ ආර්. ප්‍රේමදාසගේ ජනතාවාදී දර්ශනය මත සිදුකරන ලද සංවර්ධන ව්‍යාපෘති තුළ දක්නට ලැබුණු සංස්කෘතික දේශපාලනයේ සුවිශේෂ මුහුණුවරක් ගත්තේ ය. ගම ගොඩනැගීම මඟින් රට ගොඩනැගීමේ තේමාව තුළ සිට ප්‍රජා සංවර්ධන කටයුතු මෙහෙයවීම සමකාලීන විප්ලවීය, මතවාදාත්මක වෙනසක් උදා කළ අතර ගම් උදා ව්‍යාපාරය තුළින් මෙම දැක්ම මනාව පිළිබිඹු විය (Hennayake 2006: 133). මෙම ගම් උදා සංකල්පය තුළ ප්‍රාදේශීය සංස්කෘතික උරුම සංරක්ෂණයට ද ප්‍රමුඛතාවක් හිමිවීම අපගේ අවධානයට ලක්විය යුතු ය. ගම් උදාව ව්‍යාපෘතිය තුළ ආයෝජනය කළ ව්‍යාපෘති අතර ආගමික සහ සංස්කෘතික වැඩසටහන් ප්‍රමාණය ද සැලකිය යුතු අගයක් ගනී (එම: 142). උදා ගම් ව්‍යාපාරය පිළිබඳ ලියැවුණු ගීත රචනා විශ්ලේෂණයක යෙදෙන හෙන්නායක (එම: 140) ඒවා මගින් සාමාන්‍ය ප්‍රජාවට සන්නිවේදනය කිරීමට තැත් කළ පණිවුඩයක් නම් නූතන ධනවාදී සංවර්ධනය තුළ අතීත ශ්‍රී විභූතිය සහ සංස්කෘතික අනන්‍යතාව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව බව කියයි. සෑම ගම් උදා භූමියක ම අතීත සිංහල බෞද්ධ අනන්‍යතාව සහ උරුමය සිහිගන්වන ඉදිකිරීම් සඳහා ප්‍රමුඛත්වයක් හිමි විය. ඒ මගින් අතීත පාලකයින් සහ අතීත උරුමය අතර වූ සබඳතාව නූතන පාලකයින් ද අඛණ්ඩව පවත්වාගෙන යන බව ජන මනසට සූක්ෂ්මව සන්නිවේදනය කරමින් දේශපාලන බලය තහවුරු කරගැනීම උපක්‍රමයක් විය (එම: 145). කර්ට්සර් (Kertzer 1988: 9 - 10) සඳහන් කරන පරිදි ගම් උදාව අතීතය සහ වර්තමානය යා කරන ප්‍රතිඵලදායී සංවර්ධන ව්‍යාපෘතියකි. සිංහල බෞද්ධ සංස්කෘතික අනන්‍යතාව සම්බන්ධයෙන් ගත් කල එය සංරක්ෂණවාදී වන අතර නූතන සංවර්ධනාත්මක දෘෂ්ටිකෝණයෙන් නිර්මාණාත්මක ය.ගම් උදාව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී හමු වූ ස්ථාන ආරක්ෂා කිරීම සහ ගම්උදාවට අදාළ ප්‍රදේශයේ උරුමය නගා සිටුවීමට කටයුතු කිරීම මෙම ව්‍යාපාරයෙන් ඉටු විය. නිදසුන් ලෙස පෙන්වා දෙන්නේ නම් හිඟුරක්ගොඩ ගම් උදා භූමිය තුළ පොළොන්නරු යුගයට අයත් සෙල්ලිපි සහ ස්මාරක ප්‍රතිසංස්කරණය කිරීම, බුත්තල ගම් උදාව ක්‍රියාත්මක කිරීමේ දී තදාශ්‍රිත මාළිගාවිල, දඹේගොඩ ආදී ස්ථානවල එතෙක් අතහැර දමන ලද කැඩී බිඳී ගිය දැවැන්ත බුදු පිළිමය සහ අවලෝකිතේශ්වර බෝසත් ප්‍රතිමාව සංරක්ෂණය කොට මහජනතාව වෙත ඉදිරිපත් කිරීම, තිස්සමහාරාම ගම් උදාව මගින් සඳගිරි දාගැබ සංරක්ෂණය, කඹුරුපිටිය ගම් උදාව මගින් මාතර කොටුව සහ තදාශ්‍රිත ප්‍රදේශය සංරක්ෂණය කිරීම, මිහින්තලේ ගම් උදාව මගින් මිහින්තලේ ඉන්දීය සාංචි ස්තූප අනුරුව සහ අනුරාධපුරය පූජා නගරයේ සංරක්ෂණ සහ සංවර්ධන කටයුතු රැසක් සිදු කිරීමට පියවර ගැනීම දැක්වීමට හැකිය (ගුණවර්ධන 2005: 164). දේශපාලන නායකත්වයේ අවශ්‍යතාව තේරුම්ගත්

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වෘත්තිකයින්ට දශක කීපයක් ඉටු කරගත නොහැකිව තිබූ උක්ත ක්‍රියාකාරකම් සිය වගකීමක් සේ සලකා ක්‍රියාවට නගනු ලැබී ය. ඒ සඳහා අවශ්‍ය සම්පත් දේශපාලන මැදිහත්වීමකින් සපයා ගත හැකි විය (Wijesuriya 1993: 8). කෙසේ වෙතත් උක්ත ප්‍රදේශවල සංවර්ධන ව්‍යාපෘතීන්ට පෙර පූර්ව හානි ඇගයුමක් සිදු වූ බව දක්නට නොලැබේ.

| කාලය | බලයේ සිටි දේශපාලන පක්ෂය | ප්‍රතිපත්ති සහ ප්‍රධාන ව්‍යාපෘති |
|---|---|---|
| 1977 - 1994 | එක්සත් ජාතික පක්ෂය | • උරුමය ගෝලීයකරණය, ජගත් උරුම සංකල්පය හරහා යුනෙස්කෝ ශ්‍රී ලංකා සංස්කෘතික ත්‍රිකෝණ වැඩසටහන.<br>• සංචාරක ව්‍යාපාරය හරහා උරුමය වාණිජකරණයට ලක් කිරීම.<br>• ගම් උදා සංකල්පය වැනි සංවර්ධන ව්‍යාපෘති සමග උරුමය බද්ධ කිරීම.<br>• බෞද්ධ උරුමය ව්‍යවස්ථාපිත සංරක්ෂණයට පියවර ගැනීම.<br>• පූජා නගර සැලසුම් හරහා උරුම ක්ෂේත්‍ර සංරක්ෂණය සහ සංවර්ධනය.<br>• ව්‍යවස්ථාපිත ආයතන ස්ථාපිත කිරීම. සංරක්ෂණ මූල්‍යායනය අරමුණු කර ම. ස. අ. ස්ථාපිත කිරීම, දේශපාලන බලය ස්ථාපිත කිරීම උදෙසා ව්‍යාපෘති සැලසුම් කිරීම. |
| 1994 | එක්සත් ජනතා නිදහස් සන්ධානය | • සංවර්ධන ව්‍යාපෘතීන්ගෙන් උරුමය ආරක්ෂා කිරීම සඳහා හඳුන්වා දීම.<br>• ජාතික උරුමයන් සඳහා අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීම.<br>• වයඹ සංස්කෘතික චතුරශ්‍රය හා දකුණේ සංස්කෘතික කවය හඳුන්වා දීම.<br>• ‘උරුම අරුණ‘ අරමුදලක් ස්ථාපිත කිරීම. |

පශ්චාද් යටත් විජිත (Post Colonial) ශ්‍රී ලංකා සමාජය තුළ සංස්කෘතික උරුමය විවිධ වූ විචල්‍ය සංවර්ධන ප්‍රවේශ එනම් ධනවාදී, සමාජවාදී සහ දේශීය මානයන් සහ දර්ශනයන් තුළ දෝලනය වී ඇති බව හඳුනාගත හැකි ය. උක්ත ප්‍රවේශයන්ගේ බලපෑම උරුම සංරක්ෂණ සහ සැලසුම්කරණ සහ ප්‍රතිපත්ති සඳහා ඍජුවම බලපා තිබේ.

**සංස්කෘතික උරුමයේ සමාජ දේශපාලනික භාවිතය**

සංස්කෘතික උරුමය දැනුම පාදක කරගත් සංස්කෘතික නිර්මාණයක් මෙන් ම දේශපාලනමය සම්පතකි (Graham et al. 2000). ලොවෙන්තල් (Lowenthal 1985) උරුමයේ සමාජ දේශපාලනික භාවිතය පිළිබඳව කරුණු දක්වන අතර, ග්‍රැහැම් (Graham 1999) අනන්‍යතාව තහවුරු කිරීමේ සාධකයක් ලෙස උරුමයේ කාර්යභාරය විග්‍රහ කරයි. උරුමය තුළින් සන්නිවේදනය කරනු ලබන පණිවුඩය සහ දැනුම විවිධ සමාජ බුද්ධිමය වාතාවරණයන් තුළ විවිධාකාරයෙන් සාධාරණීකරණය කරනු ලැබේ (Livingstone 1992). දේශපාලඥයින් විසින් සංස්කෘතික උරුමය සිය දේශපාලන මතවාද, අරමුණු (උදා : ජාතිවාදී, ජාතිය ගොඩනැගීම) සාධාරණීකරණය කරනු වස් භාවිත කරනු ලැබේ. මෙම භාවිතය බොහෝ විට සාවද්‍ය භාවිතයක් (misuse) ලෙස ද, විටෙක අතිශයෝක්තියෙන් යුතු අධිභාවිතයක් (over use) ලෙස ද විටෙක නොසලකා හරින ඌන භාවිතයක් (under use) ලෙස ද හඳුනාගත හැකි ය.

සංස්කෘතික උරුමයේ සමාජ, දේශපාලනික භාවිතයේ ශ්‍රී ලාංකේය ආකල්පයන්ගේ එදා මෙදාතුර පසුබිම විමසීමේ දී පැහැදිලි වන යථාර්ථයක් නම් එය ඉතා සමීපව රාජ්‍ය ප්‍රතිපත්ති සමඟ අවියෝජනීය ලෙස බද්ධ වී පැවති බව ය. මේ බව විවිධ සමාජ, ආර්ථික සංවර්ධනාත්මක අවධි තුළින් පිළිබිඹු වේ (Wijesuriya 1993 : 2-18). උක්ත සබඳතාව දෙදරා යන්නේ යටත් විජිත බලපෑමත් සමග ය (Bandaranayake 1975 : 10 ; Wijesuriya 1993 : 7). ඒ අනුව යටත් විජිත පාලනය කළ ප්‍රතිපත්ති සහ ආකල්ප උරුමයේ දේශපාලනික භාවිතය සම්බන්ධ තවත් පැතිකඩකි. වසර සිය ගණනක් සංස්කෘතික උරුම නොසලකා හරින ලද පසුබිමක ඊට ප්‍රතිවිරුද්ධ බලවේගයක් ලෙස ආගමික පුනරුද ව්‍යාපාරයක් (Religious revival movement) පැන නැගුණ අතර එයට පසුව නිදහස සඳහා අරගලයක් බවට පත් විය (Bandaranayake 1975 : 11). මේ හා ඒකාබද්ධ වූ ක්‍රියාදාමයක් නම් අතීත ආගමික උරුමස්ථාන ස්මාරක ප්‍රතිසංස්කරණ සමාගම් මගින් ප්‍රතිසංස්කරණයට පෙලඹීමයි. ප්‍රජා උද්යෝගය තුළින් ප්‍රජා සංගත සමාගම් හරහා ආගමික ස්මාරක ප්‍රතිසංස්කරණය වන විට නෛතිකව ඒවා පාලනය කිරීමට ද යටත් විජිත පාලනය ක්‍රියාකර ඇති අයුරු 1940 පුරාවස්තු ආඥාපනත මගින් පැහැදිලි වේ.

නිදහසින් පසු රාජ්‍ය යාන්ත්‍රණය සහ දේශපාලනඥයෝ ප්‍රජා උද්‍යෝගය නිසා ම ආගමික ස්මාරක ප්‍රතිසංස්කරණයට යොමු වූහ. මේ යුගයේ ස්තූප ප්‍රතිසංස්කරණ ඍජුව ම දේශපාලනඥයින් විසින් මෙහෙයවනු ලැබිණ. රාජ්‍ය යාන්ත්‍රණය රජයේ දෙපාර්තමේන්තු හරහා මුදල් ප්‍රතිපාදන සැපයූ අතර බොහෝවිට අග්‍රාමාත්‍යවරයා ඒ සඳහා මූලිකත්වය ගැනීම සිදු විය. යටත් විජිත පාලනය තුළ ප්‍රතිසංස්කරණ පාලනය සඳහා ස්ථාපිත නෛතික පදනම (Antiquities Ordinance 1940) අවශ්‍ය පරිදි භාවිත කරමින් ජනතා අවශ්‍යතා ඉටුකිරීමට දේශපාලනඥයින් ස්මාරක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මැදිහත් විය. එක්දහස් නවසිය හැත්තෑ එකේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව හරහා බුදු දහමට සහ සෙසු ආගම් සඳහා හිමි නිශ්චිත ස්ථානය සඳහන් කෙරිණ. මෙය තවදුරටත් 1978 විධායක ජනපති ක්‍රමය මගින් ශක්තිමත් කෙරිණි.

එක්දහස් නවසිය හැත්තෑ හතේ බලයට පත්වන එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවත් සමග විවෘත ආර්ථික ප්‍රතිපත්ති හරහා උරුම සංරක්ෂණයේ ප්‍රවණතා විවිධාකාරයෙන් පරිණාමයට පත්වන ආකාරය දැකගත හැකි ය. සංස්කෘතික සම්පත් ආර්ථික සංවර්ධනයේ ගාමක බලවේගයක් කර ගැනීම

සඳහා දේශපාලනික මැදිහත්වීම උපරිමයෙන් සිදු විය. ජගත් උරුම ප්‍රඥප්තිය පිළිගැනීම, ජගත් උරුම ප්‍රකාශයට පත් කිරීම හරහා උරුමය ගෝලීයකරණයට ලක් කරමින් සංචාරක ව්‍යාපාරය තුළින් ආර්ථික සංවර්ධනයට පදනම සැකසිණ. එක්දහස් නවසිය හැත්තෑ හතේ බලයට පත් එක්සත් ජාතික පක්ෂය මගින් ඇරඹූ 'උදාගම්' ව්‍යාපාරය යටතේ දිවයිනේ බොහෝ ප්‍රදේශවල සංස්කෘතික උරුමස්ථාන කඩිනම් ව්‍යාපෘති ලෙස ක්‍රියාවට නැගුණි. නිදසුනක් ලෙස බුත්තල ගම් උදාව ක්‍රියාත්මක කිරීමේ දී තදාශ්‍රිත මාළිගාවිල, දඹේගොඩ, ආදි ස්ථානවල එතෙක් අතහැර දමන ලද බුදුපිළිමය හා අවලෝකිතේශ්වර බෝධිසත්ව ප්‍රතිමාව සංරක්ෂණය කොට මහජනතාව වෙත ඉදිරිපත් කිරීම, තිස්සමහාරාම ගම් උදාව මඟින් සඳගිරි දාගැබ සංරක්ෂණය, කඹුරුපිටිය ගම් උදාව හරහා මාතර කොටුව හා තදාශ්‍රිත ප්‍රදේශය සංරක්ෂණය කිරීම දේශපාලනික ලෙස ජනප්‍රසාදයට හේතු වූ උරුම සංරක්ෂණ ක්‍රියාදාම ය. එක්දහස් නවසිය හැත්තෑ නවයේ වසරේ මාස 5 ක් තුළ සිදු වූ මිරිසවැටි ස්තූප ප්‍රතිසංස්කරණය එහි ප්‍රතිඵලයක් වූ අතර ප්‍රතිසංස්කරණ සමාගමේ සභාපති වූයේ ද එවකට ජනාධිපතිවරයාය. උක්ත කටයුත්ත සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පවා පාර්ලිමේන්තුව විසින් වෙනත් කටයුතු සඳහා අනුමත කළ ප්‍රතිපාදන මඟින් ලබා ගනිමින් මූල්‍ය අවශ්‍යතාව සපුරාගත් අතර එවකට විපක්ෂය උක්ත මුදල් භාවිතය ප්‍රශ්න කළත් එය ප්‍රබල ආගමික ප්‍රජා අවශ්‍යතාවක් වූ බැවින් ප්‍රබල විරෝධයක් මතු නොවුණි. එක්දහස් නවසිය අසූ හත වසරේ මිරිසවැටිය ස්තූපය හදිසියේ බිඳ වැටුණු පසුව ද නැවත ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් සාර්ථකව කළ හැකි වූයේ ද ප්‍රබල දේශපාලන මැදිහත්වීම මත ය.

එක්දහස් නවසිය හැත්තෑ හතේ බලයට පත් එක්සත් ජාතික පක්ෂ රජය මගින් ගෙන ආ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා ඒ වන විට පැවති 1946 අංක 49 නගර හා ග්‍රාම නිර්මාණ පනත ආදී පනත් තුළින් පූජා නගර සැලසුම් යෝජනා ක්‍රම ආරම්භ කළ අතර ඒ තුළින් ආගමික භේදයකින් තොරව සුවිසල් ඓතිහාසික මධ්‍යස්ථාන බැතිමතුන්ගේ වන්දනය හා පූජනය සඳහා වෙන් වූ ස්ථාන ලෙස රාජ්‍ය හා මහජන ප්‍රතිපාදන තුළින් සංවර්ධනය කිරීම සඳහා තත්කාලීන දේශපාලන තන්ත්‍රය මගින් පියවර ගන්නා ලදි. අනුරාධපුර, මහනුවර, දඹුල්ල වැනි ජගත් උරුමස්ථාන පූජා ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් වී සංවර්ධනය වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙස ය. මේ ප්‍රවේශය හරහා ඓතිහාසික ස්මාරක ආරක්ෂා කිරීම,ඒ හාත්පස අයථා සංවර්ධනයන් පාලනය කිරීම, වන්දනාකරුවන් සහ සංචාරකයින් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සිදු විය. ශ්‍රී ලංකාවේ ජනාධිපති ලෙස තේරීපත් වූ ආර්. ප්‍රේමදාස මහතා දිවුරුම් දීම සඳහා තෝරාගනු ලැබුවේ ජගත් උරුමස්ථානයක් මෙන් ම බෞද්ධයින්ගේ මුදුන් මල්කඩ බඳු වූ මහනුවර දළදා මන්දිර පත්තිරිප්පුවයි. පත්තිරිප්පුව බ්‍රිතාන්‍ය පාලනයට පෙර ශ්‍රී ලංකාවේ අවසන් රජු විසින් ඉදි කරන ලද ව්‍යුහයකි. මේ ඔස්සේ ලබා දුන් සංකේතාත්මක පණිවුඩය ලෙස යටත් විජිත පාලනය තුළ යම් ප්‍රමාණයකට විසන්ධි කළ බෞද්ධ උරුමය හා දේශපාලන තන්ත්‍රය යළි ස්ථාපිත කිරීමක් ලෙස අර්ථ දැක්විය හැකි ය. එය ප්‍රජාවට සමීපවීමේ දේශපාලන උපාය මාර්ගයක් ලෙස ද හැඳින්විය හැකි ය. උක්ත ප්‍රවේශය තුළින් ජීවමාන ඓතිහාසික ක්ෂේත්‍ර සංවර්ධනයට දේශපාලන යාන්ත්‍රණයේ මැදිහත්වීම සාර්ථකව ලබාගත හැකි වූ, එමෙන් ම ලබාගත හැකි බව මනාව ඔප්පු කළ ක්‍රියාදාමයකි. නිදසුනක් ලෙස අනුරාධපුර පූජා ප්‍රදේශ සැලසුම් යෝජනා ක්‍රමය (Anuradhapura sacred area planning scheme) යටතේ අනුරාධපුර වර්ග සැතපුම් 14 ක් ආවරණය වන පරිදි සංවර්ධන සැලැස්මක් සැකසුණ අතර ඒ හරහා ඉහළ ම දේශපාලන අනුග්‍රහය මඟින් සියලු ම පාර්ශ්වකරුවන් එක රාමුවක් යටතට ගෙන නව

කළමනාකරණ ව්‍යූහයක් තුළින් පූජනීය නගරය සංරක්ෂණයට කටයුතු ඇරඹිණ (Wijesuriya 1993). 1988 බුද්ධශාසන අමාත්‍යාංශය ජනාධිපති යටතේ ම ස්ථාපිත කිරීම තුළින් ස්පර්ශනීය සහ අස්පර්ශනීය බෞද්ධ උරුමය ආරක්ෂා කිරීමට මහගු පිටුවහලක් විය. පසුගිය දශක තුන තුළ වඩාත් ම සාර්ථක උරුම සංරක්ෂණ හා කළමනාකරණ ප්‍රවේශය නම් එවකට රජයේ ප්‍රමුඛ මැදිහත්වීම මත 1981 හඳුන්වා දුන් මධ්‍යම සංස්කෘතික අරමුදල සහ සංස්කෘතික ත්‍රිකෝණ ව්‍යාපෘතියයි. මේ හරහා මධ්‍යම සංස්කෘතික අරමුදලට මුදල් එක්රැස් කිරීමේ හා වැය කිරීමේ බලතල ලබා දුන් අතර රාජ්‍ය බදු මුදලින් නිදහස් කෙරිණ. මෙය නිදහසින් පසු රජයක් විසින් ශ්‍රී ලංකාවේ උරුම සංරක්ෂණ ක්‍රියාදාමයේ තිරසාරභාවය වෙනුවෙන් සිදු කළ දැවැන්ත ම දූරදර්ශී ක්‍රියාමාර්ගයයි. රජයේ අග්‍රාමාත්‍යවරයා මධ්‍යම සංස්කෘතික අරමුදලේ සභාපතිවරයා වීමෙන් හා අමාත්‍යාංශ රැසක ඇමතිවරු හා ලේකම්වරු එහි සාමාජිකයින් වීමෙන් ම ඒ සඳහා ලැබුණු රාජ්‍ය අනුග්‍රහය පිළිබිඹු වේ.

ජනවාර්ගික යුද්ධය සමග එල්. ටී. ටී. ඊ. (LTTE) සංවිධානය තුළින් ශ්‍රී ලාංකේය ආර්ථික, සමාජීය සහ ආගමික උරුමස්ථානයන්ට තර්ජනය එල්ල වන්නට විය. විශේෂයෙන් අනුරාධපුර ජගත් උරුම භූමියේ ශ්‍රී මහා බෝධියටත්, මහනුවර ජගත් උරුම භූමියේ ශ්‍රී දළදා මාලිගාවටත් (1998) ත්‍රස්ත ප්‍රහාර එල්ල විය. මෙය සිදු වන්නේ LTTE සංවිධානය උක්ත ජගත් උරුමස්ථාන අනන්‍යතාව සිංහල බෞද්ධ අනන්‍යතාවක් පමණක් ලෙස වරදවා කියවීමේ ප්‍රතිඵලයක් ලෙස විය හැකි ය. එදා මෙදාතුර රටේ පාලකයින් සිංහල බෞද්ධ ප්‍රජාව ජීවිතයේ බොහෝ සුවිශේෂ අස්ථාවල දී උක්ත ස්ථාන කරා ගොස් පිහිට ප්‍රාර්ථනා කිරීමට පුරුදුව සිටියා පමණක් නොව, උක්ත ආගමික වන්දනයේ බලයෙන් රට ආක්‍රමණවලින් ආරක්ෂා කර දෙන බවට ඔවුන් තුළ විශ්වාසයක් ද විය. එහෙයින් එම වස්තු ඉලක්ක කර පහර දීම සහ විනාශ කිරීම රටේ පාලකයින්ට හා සිංහල බෞද්ධ ප්‍රජාවට පහර දීමක් සේ එම සංවිධානය සිතන්නට ඇත. එහෙත් උක්ත ස්ථාන ජගත් උරුම භූමි තුළ පිහිටි ජගත් උරුමයේ නියෝජනයන් වීම නිසා ම ජගත් උරුම ප්‍රඥප්තියට අනුව සමස්ත විශ්වීය මානව ප්‍රජාවගේ ම උරුමයන් වන්නේ ය.LTTE සංවිධානය ද සමස්ත මානව ප්‍රජාව යන්නෙන් අර්ථවත් වන බැවින් ඔවුන් ද එය සුරැකීමේ පාර්ශ්වකරුවන් විය යුතුව තිබුණි. එහෙත් එම පෘථුල විශ්වීය කියවීමට ඔවුන්ගේ අන්තවාදී දෘෂ්ටිවාදය බාධකයක් වන්නට ඇත. ඔවුනට ඒ තුළින් මුදුන් පමුණුවා ගත යුතු අදූරදර්ශී ජයග්‍රහණයක් පවතින්නට ඇත. සුදර්ශන් සෙනෙවිරත්න නිරීක්ෂණය කරන පරිදි උක්ත සංකේතද්වයම සිංහල - බෞද්ධ අනන්‍යතාව උතුරු ඉන්දීය ආර්ය සබඳතාව නිරූපණය කරන උරුම සංකේත වීම මේ සඳහා හේතු වන්නට ඇත. ජගත් ප්‍රජාව උක්ත ක්‍රියාදාමය හෙළා දුටු අතර, ශ්‍රී ලංකා රජය ද LTTE සංවිධානයට එරෙහිව ප්‍රචාරණයට මෙම ජගත් උරුම විනාශය ප්‍රබල අවියක් කර ගත්තේ ය. 50 වන නිදහස් සමරුවට දින 10 කට පෙර විනාශ වූ දළදා මැදුර එම නිදහස් සැමරුමේ ප්‍රධාන ආරාධිත අමුත්තකු වූ චාල්ස් කුමරු එම මන්දිරය නැවත ප්‍රතිසංස්කරණයට දායක වන ලෙස ජගත් ප්‍රජාවගෙන් ඉල්ලා සිටියේ ය. විනාශ වූ දළදා මන්දිරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සාමාන්‍ය ප්‍රජාව, ආගමික ප්‍රජාව මෙන් ම දේශපාලන නායකත්වය ප්‍රමුඛව ක්‍රියා කෙරිණි. හදිසි අවස්ථාවල කටයුතු කරන ප්‍රබල ම දේශපාලන යාන්ත්‍රණය වන ජනාධිපති කාර්ය සාධක බලකාය (Presidential Task Force) ජනාධිපතිගේ සහභාගීත්වය යටතේ ක්‍රියාත්මක විය.

ජනවාර්ගික ගැටලුවට විසඳුමක් ලෙස ගෙන ආ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව පළාත් සභාවලට බලය විමධ්‍ය ගත වන අතර විමධ්‍යගත නොවන බලතල පිළිබඳව ද සඳහන් වේ. ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්මාරක හා ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සලකන විට

ජාතික ස්මාරක (National Monuments) ලෙස ප්‍රකාශයට පත් කර ඇති ස්මාරක සඳහා පමණක් මැදිහත් වීමට මධ්‍යම රජයට බලතල පවතී. එවකට පැවති 1940 පුරාවස්තු ආඥා පනතට අනුව ජාතික ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කිරීමට ප්‍රතිපාදන නොවූ හෙයින් තත් පනතට අනුව ස්මාරක සහ ක්ෂේත්‍ර ලෙස ප්‍රකාශයට පත් කර තිබූ සියලු ස්ථාන ජාතික ස්මාරක ලෙස නිරායාසයෙන් ප්‍රකාශයට පත් කෙරෙන පනතක් අවශ්‍යව තිබූ මොහොතක ඉතා කෙටි කලක් තුළ පාර්ලිමේන්තුව මගින් ඒකමතිකව 1989 ජාතික වටිනාකමක් සහිත පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර පනත (Archaeological sites of natonal importance Act 1989) හඳුන්වාදීමට කටයුතු කෙරිණ. මේ හරහා ජාතික වශයෙන් වැදගත් උරුමස්ථාන මධ්‍යම රජයේ රැකවරණයට නතුකර ගත් අතර එය අතීතයේ පටන් පැවති සම්ප්‍රදායක් වන උරුමය, රාජ්‍යය හා පාලකයා අතර සමීප සබඳතාව ස්ථාවරව පවත්වා ගැනීමට කටයුතු කිරීමකි.

**නිගමනය**

ශ්‍රී ලාංකේය උරුමය සංරක්ෂණය පිළිබඳ සම්ප්‍රදායික යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යයනයෙන් පැහැදිලි වන යථාර්ථයක් නම් නූතන උරුමය ගෝලීයකරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වී ඇති බටහිර සංරක්ෂණ උපායමාර්ගවලට හා සුසමාදර්ශයන්ට විකල්ප වූ සංරක්ෂණ සම්ප්‍රදායක් ශ්‍රී ලංකාව සතු බවයි. මෙම යාන්ත්‍රණය තීරණාත්මක ලෙස යටත්විජිත හා පශ්චාත් යටත්විජිත සමයෙහි දී අභියෝගයට ලක් වීම හඳුනා ගත හැකි අතර, සන්දර්භවලට අනන්‍ය වූ සාධක නොසලකා ඒ මත නූතන ක්‍රමවේද හා සුසමාදර්ශ ආරෝපණය කිරීමට යාම තුළ ක්ෂේත්‍රයන්හි ගැටලු රැසක් නිර්මාණය වී ඇති බව පෙනේ. එබැවින් මෙකී ප්‍රතිඵලවලින් ප්‍රකාශ වන්නේ ශ්‍රී ලාංකේය, විශේෂයෙන් ජීවමාන පූජනීය සංස්කෘතික උරුම සංරක්ෂණයේ දී සාම්ප්‍රදායික සංරක්ෂණ ඥානය, න්‍යාය, භාවිතය හා දෘෂ්ටිවාදයෙන් වියුක්ත වීම පිළිබඳ නැවත සිතා බැලිය යුතු කාලය එළඹ ඇති බවයි. ශ්‍රී ලාංකේය පූජනීය ජීවමාන උරුමය හා බද්ධ වූ සංකීර්ණ සමාජීය මාන අවතක්සේරුව දිගුකාලීනව උරුමයේ තිරසාරභාවය අර්බුදයට හෙළීමකි. සංස්කෘතික උරුමයේ සමාජ, දේශපාලනික භාවිතයේ ශ්‍රී ලාංකේය ආකල්පවල එදා මෙදාතුර පසුබිම විමසීමේ දී පැහැදිලි වන යථාථියක් නම් එය ඉතා සමීපව රාජ්‍ය ප්‍රතිපත්ති සමඟ අවියෝජනීය ලෙස බද්ධ වී පැවති බව ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**


අනුරාධපුර පූජා ප්‍රදේශ සැලසුම් යෝජනා ක්‍රමය (2008) නාගරික සංවර්ධන අධිකාරිය.

කොළඹ.අනුරාධපුර නගර සංවර්ධන සැලැස්ම (2020) නාගරික සංවර්ධන අධිකාරිය.

කොළඹ.කරුණානන්ද, යූ. (1990)නුවර කලාවිය, කැලණිය: ශිලා ප්‍රින්ටර්ස්.

-----(2001)බ්‍රිතාන්‍යයන් යටතේ උතුරුමැද පළාත, මරදානඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කරුණාරත්න, ඩබ්ලිව්. ඇස්. (1990) 'ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාවේ ඉතිහාසය 1890-1910',පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය, (සංස්.) එන්. විජේසේකර, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පිටු 3-6.

පී.ගුණවර්ධන, පී සහ එම්. සල්ඩින්. (2008)සංචාරක කර්මාන්තය දියුණු වෙමින් පවත්නා රටවල් සහ සංචාරක නිෂ්පාදනය, ජා ඇලඃ සමන්ති ප්‍රකාශකයෝ.

ගොඩකුඹුර, සී. (1962) 1960-61 මුදල් වර්ෂය සඳහා පුරාවිද්‍යා කොමසාරිස්ගේ පාලන වාර්තාව, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

දේවරාජා, එල්. එස්. (1967)උඩරට රාජධානිය, පාදුක්කඃ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

ධම්මානන්ද, එස්. (1969) මධ්‍යම ලංකා පුරාවෘත්ත, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

පතිරණ, යූ. පී. එස්. (2010)සංචාරක ව්‍යාපාරය (පසුබිම, බලපෑම හා නව ප්‍රවණතා), දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශකයෝ.

පරණවිතාන, එස්. (1963)ලංකාවේ ස්තූපය, බොරලැස්ගමුව: විසිදුනු.

මල්සිරි, ඩබ්ලිව්. (2011)ශ්‍රී ලංකාවේ වාස්තුවිද්‍යා උරුම සංරක්ෂණයේ ඓතිහාසික විකාශනය: ක්‍රමවේද, සංකල්ප හා භාවිතය, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාජපක්ෂ, ඒ. (2002) නූතන උරුම කළමනාකරණ සංකල්පය සහ අනුරාධපුර ලෝක උරුම නගරයේ උරුම කළමනාකරණ ක්‍රියාදාමය, වැලිපිල පුරාවිද්‍යා සඟරාව (පස්වැනි කලාපය), කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල.

රාජපක්ෂ, ඒ. (2013) 'දළදා උරුමයඃ අනන්‍යතාව, අර්ථකථනය හා කළමනාකරණය', ධීරානන්ද, එච්. (සංස්.)සිරි දළදා හරසරණිය, කොළඹ: රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව. පිටු. 695-717.

රාහුල, වල්පොළ. (1959)ලක්දිව බුදුසමයේ ඉතිහාසය, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

විමලරත්න, කේ. ඩී. ජී. (1995) බුදුසසුන පිළිබඳ බ්‍රිතාන්‍ය ප්‍රතිපත්ති, අපේ සංස්කෘතික උරුමය, නුගේගොඩ: දීපානි ප්‍රකාශන. පිටු. 213-239.

විමලානන්ද, ටී. (1963)උඩරට මහ කැරැල්ල, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

විමලරත්න, කේ. ඩී. ජී. (1993)ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය, කොළඹ: රත්න ප්‍රකාශකයෝ; 1991, බ්‍රිතාන්‍යයන් යටතේ ලංකාවේ විහාර ඉඩම් පාලනය, දෙහිවල: ස්වර්ණ ලේඛා.

විසල් අනුරාධපුර සංවර්ධන යෝජනා ක්‍රමය (1999)නාගරික සංවර්ධන අධිකාරිය, කොළඹ.

සිල්වා, ආර්. (1985)1981 වර්ෂය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලේ පළමුවන වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකාව: රාජ්‍ය මුද්‍රණ සංස්ථාව.

සිල්වා, ඩී. ඒ. සී. එස්. සහ ජී. ගුරුගේ. (2011)සංචාරක ප්‍රවර්ධන ප්‍රවේශ, මරදාන: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෙනෙවිරත්න, ඒ. (2001)සිරි දළදා වරුණ, මරදාන: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෙනෙවිරත්න, ඒ. (2002)කන්ද උඩරට මහනුවර, කොළඹ : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

හරිශ්චන්ද්‍ර, ඩබ්ලිව්. (2001)සිතියම් සහිත පුරාවිද්‍යාව, බොරලැස්ගමුව: විසිදුනු.

හෙට්ටිආරච්චි, ඇස්. බී. (1990) පුරාවිද්‍යා රක්ෂිත ප්‍රකාශයට පත්කිරීම, එළිපෙහෙළි කිරීම, නඩත්තු කිරීම හා පරිසර සැකසීම 1910-1930, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉතිහාසය, (සංස්). එන්. විජේසේකර, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව. පිටු. 47-78.

*Antiquities Ordinance of 1940, Sri Lanka.*

*Archaeological survey of Ceylon Annual Repots*, 1933.

*Archaeological survey of Ceylon Annual Repots*, 1940 p. 45.

*Archaeological survey of Ceylon Annual Repot,* 1961 / 62, p.233.

*Archaeological sites of Natonal importance Act 1989, Sri Lanka.*

Fernando, W.B.M. (1990) 'History of the Department of Archaeology 1930-1950', *History of Department of Archaeology*, Commemorative Vol. N.Wijesekara (ed.), Colombo, pp. 71-110.

Bandaranayake, S.(1975) 'International Recognition of the Problems of Conserving Cultural Monuments and Ancient City Centres', paper given at the Asian Regional Conference of the Commonwealth Association of Architects, Colombo.

Berchert, H. (1978) 'S.W.R.D. Bandaranaike and the legitimation of power in Sri Lanka'. In: Smith B.L. (ed.) *Religion and legitimation of power in Sri Lanka*. India: Anima Books.

Graham B., Ashworth, G. J. and Tunbridge, J. E. (2000*) A Geography of Heritage: Power, Culture and Economy*. London: Arnold.

Hennayake, N. (2006) *Culture, Politics and Development in Post-Colonial Sri Lanka*.Lexington Books.

Kertzer, D. (1988) *Rituals, Politics and Power*, London: Yale University Press.

Livingstone, D. N. (1992) *The Geographical Tradition*. Oxford: Blackwell.

Lowenthal, D. (1985) *The Past is a foreign country*. Cambridge: Cambridge University Press.

Nash, D. (1977) 'Tourism as a form of Imperialism'. *Hosts and guests:* in: Smith, V. (ed.) *The Anthropology of Tourism*. Oxford: Blackwell, pp. 33-47.

Oertel, f. O. (1903) 'Report of the Restoration of Ancient Monuments at Anuradhapura, Ceylon' Colombo: *Ceylon government Sessional Papers*.

Ponnambalam, S. (1980) *Dependent Capitalism in Crisis: The Sri Lankan Economy*, London Zed press.

Robins.K. (1977) Global Times: What in the world's going on? In: Du Gay, P. (ed.) *Production of Culture/Cultures of production*, 1997, London, Sage.

Silva, R. 'Conservation of ancient monuments under tropical conditions with special reference to Ceylon', *Ancient Ceylon*, 1969, *vol.3*, Colombo, Department of Archaeology, p. 84.

Singer, M. (1964) *The Emerging Elite: A study of political leadership in Ceylon*. Cambridge, MA: MIT Press.

Turner, L. and Nash, J. (1975) *The golden hordes: International Tourism and the Pleasure Periphery*. London: Constable: London.

Wijesuriya, G. (1993) *Restoration of Buddhist Monuments in Sri Lanka: The Case for an Archaeological Heritage Management Strategy*. Colombo: ICOMOS, Sri Lanka.

Wijesuriya, G. (2005). ‘Past is in the Present: Perspectives in caring for Budhist heritage’. In: Stovel, H., Stanley-Price N. and Killick, R. (ed.) *Conservation of living religious heritage. ICCROM Conservation Studies3 (ICCROM)*, Rome.